# ශ්‍රී ලංකා කජු සංස්ථාව

## இலங்கை மரமந்திரிகை கூட்டத்தாபனம்

## SRI LANKA CASHEW CORPORATION

## වාර්ෂික වාර්තාව සහ ගිණුම්

## வருடாந்த கணக்கும் அறிக்கையம்

## ANNUAL REPORT AND ACCOUNTS

## 2014

| පටුන | | පිටු අංක |
|---|---|---|
| 1. | සභාපතිවරයාගේ වාර්තාව<br>- සංස්ථාවේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ පරමාර්ථ<br>- අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය පිළිබඳ කෙටි හැඳින්වීම | 01 - 22 |
| 2. | අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 23 - 27 |
| 3. | විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | 28 - 30 |
| 4. | කාර්ය සාධන වාර්තාව | 31 - 34 |
| 5. | කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපෙක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග | 35 - 41 |
| 6. | විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන | 42 - 56 |
| 7. | 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව | 57 - 67 |
| 8. | විගණන වාර්තාවල සඳහන් අඩුපාඩු නිවැරදි කරගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග | 68 - 75 |
| 9. | වර්ෂ 5 ක ගිණුම් සාරාංශය | 76 |

# ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2014 වර්ෂය සඳහා සභාපතිගේ වාර්තාව

(01). <u>ශ්‍රී ලංකා කජු සංස්ථාව ස්ථාපනය</u>

ශ්‍රී ලංකා කජු සංස්ථාව 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1973 මැයි මස 25 වන දින අංක 60/7 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවන ලදී. සංස්ථාව ආරම්භයේ සිට රාජ්‍ය ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක වන අතර, කජු කර්මාන්තය සඳහා සියළුම සෙවාවන් සැපයීම සිදුකරන අතරතුර වාණිජ කටයුතුද ලාභදායි මට්ටමකින් සිදුකරයි.

- **දැක්ම**

ඉතාමත් උසස් තත්වයේ කජු නිෂ්පාදනය කිරීම තුලින් ශ්‍රී ලංකාව ලෝකයේ කජු අපනයනය කරන ප්‍රමුඛතම රටක් බවට පත් කිරීම.

- **මෙහෙවර**

කජු වගාව, නිෂ්පාදනය, පිරිසැකසුම් තාක්ෂණය, අගය එකතු කිරීම, පර්යේෂණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ගොවීන් සහ අදාල පාර්ශවයන් වෙත වෘත්තියමය මග පෙන්වීම ලබාදීම තුලින් දිගුකාලීන වූ වාණිජමය ශක්‍යතාවයක් ළඟාකර ගැනීමට හැකිවන පරිදි කජු කර්මාන්තය නගාසිටුවීම.

ඉලක්ක

- වගාව ව්‍යාප්ත කිරීම මගින් අස්වැන්න ඉහළ නැංවීම.
- කජු පිරිසැකසුම් කර්මාන්තයේ හා වතුයායන්වල ඵලදායිතාවය ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකාවේ කජු සඳහා ගෝලීයව පිලිගත් වෙළඳනාමයක් ඇතිකිරීම.
- අගය එකතු කිරීම හා නව නිෂ්පාදන සංවර්ධනය.
- කජු අපනයනය දිරිගැන්වීම.
- ශ්‍රී ලංකාව කජු නිෂ්පාදනයේ ප්‍රමුඛයා බවට පත්වීම.
- ලාභ ඉපයිම මගින් ස්වයංපෝෂිත රාජ්‍ය සංස්ථාවක් බවට පත්වීම.

අරමුණු

(අ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අළෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.

(ආ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අළෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම දියුණු කිරීමේ පරමාර්ථයෙන් විමර්ශන හා පර්යේෂණ කටයුතු සිදුකිරීම.

(ඇ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අළෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම පිළිබඳ තාක්ෂණික. අළෙවි හා වෙනත් තොරතුරු රැස්කිරීම, පිළියෙල කිරීම, ප්‍රසිද්ධ කිරීම සහ බෙදා හැරීම සහ ඒ කටයුතු වලදී අන් අය සමඟ එක්ව ක්‍රියා කිරීම.

(ඇ) කජු සහ කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා පිහිටුවනු ලබන කර්මාන්තශාලා පිහිටුවිය යුතු ස්ථාන, ඒවායේ ප්‍රමාණය හා තාක්ෂණික ප්‍රමිති නිශ්චය කිරීම සහ අළුත් කර්මාන්තශාලා පිහිටුවීමත් අවශ්‍ය අවස්ථාවලදී එවකට පවතින කර්මාන්තශාලා ක්‍රියා කරවීම.

(ඉ) කජු සහ කජු නිෂ්පාදන මිලට ගැනීම, බෙදා හැරීම, විකිණීම සහ අපනයනය කිරීම.

(ඊ) කජු වගා කිරීම පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම්කිරීම හා අළෙවි කිරීම පිළිබඳ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම පිණිස පහසුකම් සැපයීම.

(උ) කජු වගාවන්, පිරිසැකසුම් කිරීමේ පහසුකම් සහ අළෙවි කිරීම දියුණු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මූලික සංවිධානය පිහිටුවීම සහ ඒවා පිහිටුවීමට ආධාරදීම.

(ඌ) කජු නිෂ්පාදන ප්‍රචාරය කිරීම හා විකිණීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන පියවර ගැනීම, ලෝකයේ වෙළඳපොල වල්වල ඒ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම සහ ඒ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාර්යයන් සඳහා ප්‍රචාරක කටයුතුවලට මුදල් යෙදවීම, ඒ කටයුතු අනුපාලනය කිරීම සහ ඒ කටයුතු වලට ආධාරදීම ආරම්භ කොට ඊට අනුග්‍රහ දැක්වීම.

(02) ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය -2014

**(2.1)** 2014.01.01 දින සිට 2014.09.**19 දින දක්වා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්**

| | | | |
|---|---|---|---|
| i) | **සනත් වීරකෝන් මහතා** | - | **සභාපති** |
| ii) | එච්. අයි. ගුණවර්ධන මහතා | - | නියෝජ්‍ය සභාපති |
| iii) | එම්.ඩී. අබේගුණවර්ධන මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහා භාණ්ඩාගාර නියෝජිත |
| iv) | පී.ආර්.ජී.එල්. සී. විජේවර්ණසූරිය මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| v) | එස්.ඒ.යූ. සිල්වා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| vi) | ඒ.එම්. අම්බ්‍රෝස් මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| vii) | කේ. විදානපතිරණ මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

**(2.2)** 2014.11.19 **දින සිට පත්වූ සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්**

| | | | |
|---|---|---|---|
| i) | **පී.ආර්.ජී.එල්. සී. විජේවර්ණසූරිය මහතා** | - | **සභාපති** |
| ii) | කේ.පී.ජී. සිසිර කුමාරරත්න මහතා | | නියෝජ්‍ය සභාපති |
| iii) | එම්.අන්ද්‍රාහැන්නදි මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහා භාණ්ඩාගාර නියෝජිත (2014.12.05 දින සිට) |
| iv) | එස්.ඒ.යූ. සිල්වා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| v) | ටී.සී.එස්.ප්‍රනාන්දු මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| vi) | ආර්.එස්.කහවල මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| vii) | එස්.එල්.රණවීර මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| | 2014 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | - | වී.යූ. ලියනගේ මහතා |

## (2.3) ශ්‍රී ලංකා කජු සංස්ථාවේ විගණන හා කලමනාකරණ කමිටුව -2014

| | | | |
|---|---|---|---|
| i) | එස්. ඒ.යු සිල්වා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික කමිටු සභාපති |
| ii) | එම් අන්ද්‍රාහැන්නදි මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහා භාණ්ඩාගාර නියෝජිත කමිටු සාමාජික |
| iii) | ටී.සී.එස් . ප්‍රනාන්දු මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික කමිටු සාමාජික |
| iv) | ඩී.කේ. ජයකොඩිආරච්චි මහතා | - | සාමාන්‍යාධිකාරී කමිටු සාමාජික |
| v) | පී.බී. කොඩිකාර මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී -මානව සම්පත් සහ පාලන (2014.12.05 දින සිට) කමිටු සාමාජික |
| vi) | එම්.ටී.එස්.කේ. පීරිස් මහතා | - | සහකාර සාමන්‍යාධිකාරී - මුදල් කමිටු සාමාජික |
| vii) | වී.යු. ලියනගේ මහතා | - | සහකාර සාමන්‍යාධිකාරී අභ්‍යන්තර විගණන කමිටු ලේකම් |
| viii) | ඒ.පී.පී. අතුකෝරාළ මහත්මිය | | කමිටු නිරීක්ෂක විගණකාධිපතිදෙපාර්තමේන්තුවේ නියෝජිත |

## (2.4) ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ඉහල කළමනාකරණය

| | | | |
|---|---|---|---|
| i) | ඩී.කේ. ජයකොඩිආරච්චි මහතා | - | සාමාන්‍යාධිකාරී |

## (2.5) ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| i) | පී.බී. කොඩිකාර මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී මානව සම්පත් සහ පාලන |
| ii) | එස්.එස්.බී. රත්නායක මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී වැවිලි/ වැ.බ. සහකාර සාමාන්‍යාධිකාරී ප්‍රතිපත්ති හා සැලසුම් |
| iii) | එම්.ටී.එස්.කේ. පීරිස් මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී -මුදල් |

| | | | |
|---|---|---|---|
| iv) | ජී.බී.බී. සුරේන්ද්‍ර මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී<br>ව්‍යාප්ති හා පර්යේෂණ |
| v) | වී.යූ. ලියනගේ මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී<br>අභ්‍යන්තර විගණන |
| vi) | ආර්.එම්.පී. ජයතිස්ස මහතා | - | වැ.බ. සහකාර සාමාන්‍යාධිකාරී<br>අලෙවි හා පිරිසැකසුම් |

(2.6) <u>ලියාපදිංචි කාර්යාල</u>

**ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල**

**ප්‍රධාන කාර්යාලය**

ශ්‍රී ලංකා කජු සංස්ථාව
අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය

**දුරකථන**

| | | |
|---|---|---|
| සභාපති | - | 0112-871005 |
| නියෝජ්‍ය සභාපති | - | 0112-869844 |
| සාමාන්‍යාධිකාරී | - | 0112-876134 |

| | | |
|---|---|---|
| **ෆැක්ස්** | - | 0112-867843 |
| **ඊ මේල්** | - | cashewco@dialogsl.net |
| **වෙබ් අඩවිය** | - | www.cashew.lk |

**ප්‍රාදේශීය කාර්යාල, වතුයායන්, ශාක අභිජනන මධ්‍යස්ථාන හා පිරිසැකසුම් ඒකක**

(2.7) <u>ප්‍රාදේශීය කාර්යාල</u> <u>ආවරණය වන දිස්ත්‍රික්ක</u>

| | | | |
|---|---|---|---|
| 1. | පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය | - | පුත්තලම/ කුරුණෑගල |
| 2. | හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලය | - | හම්බන්තොට/ රත්නපුර |
| 3. | අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය | - | අනුරාධපුරය/ වව්නියා/ මන්නාරම මුලතිව් |
| 4. | නාලන්ද ප්‍රාදේශීය කාර්යාලය | - | මාතලේ/ පොළොන්නරුව |
| 5. | මොණරාගල ප්‍රාදේශීය කාර්යාලය | - | මොණරාගල |
| 6. | මහියංගණය ප්‍රාදේශීය කාර්යාලය | - | මහනුවර/ බදුල්ල |
| 7. | අම්පාර ප්‍රාදේශීය කාර්යාලය | - | අම්පාර |
| 8. | මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය | - | මඩකලපුව |
| 9. | ත්‍රිකුණාමලය ප්‍රාදේශීයකාර්යාලය | - | ත්‍රිකුණාමලය |
| 10. | කිලිනොච්චි ප්‍රාදේශීය කාර්යාලය | - | කිලිනොච්චි/ මුලතිව්/ යාපනය |

(2.8) <u>වතුයායන්</u> <u>පිහිටි දිස්ත්‍රික්කය</u>

| | | | |
|---|---|---|---|
| 1. | කමන්දළුව වතුයාය | - | පුත්තලම |
| 2. | පුත්තලම ආච්චිගෙවත්ත වතුයාය | - | පුත්තලම |
| 3. | එළුවන්කුලම වතුයාය | - | පුත්තලම |
| 4. | හාඩි වතුයාය | - | මඩකලපුව |
| 5. | මාන්කර්ණි වතුයාය | - | මඩකලපුව |
| 6. | කොණ්ඩච්චි වතුයාය | - | මන්නාරම- (සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ සංවර්ධනය කෙරේ) |

| | | | |
|---|---|---|---|
| 7. | පුනරීන් වතුයාය | - | කිලිනොච්චි-(යුධ හමුදාව විසින් පවත්වාගෙන යනු ලැබේ.) |
| 8. | මඩු වතුයාය | - | මන්නාරම- (වගා පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂිතය) |
| 9. | ඔයාමඩුව වතුයාය | - | අනුරාධපුරය |

(2.9) **ශාක අභිජනන මධ්‍යස්ථාන** **දිස්ත්‍රික්කය**

| | | | |
|---|---|---|---|
| 1. | විලච්චිය ශාක අභිජනන මධ්‍යස්ථානය | - | අනුරාධපුරය |
| 2. | නාලන්ද ශාක අභිජනන මධ්‍යස්ථානය | - | මාතලේ |
| 3. | මහඔය ශාක අභිජනන මධ්‍යස්ථානය | - | අම්පාර |
| 4. | සුදුවතුර ආර ශාක අභිජනන මධ්‍යස්ථානය | - | මොණරාගල |

(2.10) **මධ්‍යම පැළ තවාන්** **ආවරණය වන දිස්ත්‍රික්ක**

| | | | |
|---|---|---|---|
| 1. | මිහින්තලේ පැළ තවාන | - | අනුරාධපුර, වව්නියා, මන්නාරම, කිලිනොච්චි, මුලතිව් |
| 2. | දඹුල්ල පැළ තවාන | - | මාතලේ, පොළොන්නරුව |
| 3. | කමන්දළුව පැළ තවාන | - | පුත්තලම, කුරුණෑගල |
| 4. | හාඩි පැළ තවාන | - | මඩකලපුව/ත්‍රිකුණාමලය |
| 5. | කුඹුක්කන පැළ තවාන | - | මොණරාගල |
| 6. | අළුත්තරම පැළ තවාන | - | බදුල්ල/ මහනුවර |
| 7. | චන්ද්‍රිකාවැව පැළ තවාන | - | හම්බන්තොට/ රත්නපුර |

(2.11) **<u>කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන</u>** **<u>දිස්ත්‍රික්කය</u>**

1. නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය - ගම්පහ
2. පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය - පුත්තලම

(2.12) **<u>පර්යේෂණ ඒකක</u>** **<u>දිස්ත්‍රික්කය</u>**

1. කමන්දළුව පර්යේෂණ ඒකකය - පුත්තලම
2. පුත්තලම පර්යේෂණ ඒකකය - පුත්තලම

**ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රධාන ඒකාබද්ධ පර්යේෂණ සහයෝගීතාවය**

වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිළි කලමනාකරණ පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සංස්ථාව හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

(2.13) **<u>සංස්ථා කජු අලෙවිසැල්</u>** **<u>දිස්ත්‍රික්කය</u>**

1. අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය - කොළඹ
2. අංක 518, ගාළු පාර, කොළඹ 03 - කොළඹ

(2.14) **<u>සංස්ථා වරලත් කජු අලෙවිසැල් පිහිටා ඇති ස්ථාන</u>**

1. 'රන්දිය පෘට්ස් ඇන්ඩ් නට්ස්', පයාගල, මග්ගොන.
2. සුනිලා ග්‍රොසරි, අංක 35, අළුත් පාර, අම්බලන්ගොඩ.
3. P & J සිටි, ගාමිණී මාවත, ගාල්ල.
4. ෆ්‍රෙෂ් ෆාම් ෂොප්, ගාළු පාර, හික්කඩුව.
5. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, නාරාහේන්පිට.
6. Ranjanas 7 Stories, අංක 318, ගාළු පාර, කොළඹ 04.
7. ආනන්ද ෆුඩ් සිටි, අංක 272, අඹුරුවාතොට පාර, හොරණ.

8. පානදුර කෝප් සිටි, සී/ස පානදුර විවිධ සේවා සමුපකාර සමිතිය, ජනප්‍රිය මාවත, පානදුර.
9. නිව් ඇමරිකන් චිකන් හට්, 16, ශ්‍රී සාරානන්ද මාවත, කළුතර.
10. සම්පත් ෆාමසි ඇන්ඩ් ග්‍රොසරි, 39E, මාතර පාර, අකුරැස්ස.
11. සියුම් ෆුඩ් ප්‍රඩක්ට්ස්, අංක 499, කෙලින් විදිය, කෑගල්ල.
12. සීමාසහිත යටිනුවර ගඟපලාත විවිධ සේවා සමුපකාර සමිතිය, පොල්ගහමුල හන්දිය, පේරාදෙණිය.
13. සීමාසහිත යටිනුවර මැදපලාත විවිධ සේවා සමුපකාර සමිතිය, ඇඹිල්මීගම, පිළිමතලාව.
14. සීමාසහිත මධ්‍යම පලාත් සමුපකාර සමිතිය, ඇහැලේපොල කුමාරිහාමි මාවත, බෝගම්බර, මහනුවර.
15. සීමාසහත පූජාපිටිය සමුපකාර සමිතිය, පූජාපිටිය.
16. සීමාසහිත හාරිස්පත්තුව උතුර විවිධ සේවා සමුපකාර සමිතිය, මාතලේ පාර අලවතුගොඩ.
17. සීමාසහිත කුණ්ඩසාලේ විවිධ සේවා සමුපකාර සමිතිය, මැණික්හින්න.
18. සිමාසහිත මහනුවර විවිධ සේවා සමුපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, පල්ලෙකැලේ.

(2.15) <u>සංචාරක බංගලා</u> <u>දිස්ත්‍රික්කය</u>

| | | | |
|---|---|---|---|
| 1. | පුත්තලම සංචාරක බංගලාව | - | පුත්තලම |
| 2. | හාඩි සංචාරක බංගලාව | - | මඩකලපුව |


## (03) සංස්ථාවේ සංවර්ධන කාර්යයන්

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සංවර්ධන කාර්යයන් ඉටුකිරීම සඳහා සංස්ථාව ප්‍රධාන වැඩසටහන් 05 ක් ක්‍රියාත්මක කරයි.

1. **ව්‍යාප්ති සහනාධාර වැඩසටහන**
2. **වතු සංවර්ධනය, පුනරුත්ථාපනය හා ඵලදායිතාවය වර්ධනය කිරීම**
3. **අලෙවි සහ පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය**
4. **පර්යේෂණ සහ සංවර්ධනය**
5. **'දිවි නැගුම' 'දැයට කිරුළ' සහ අනෙකුත් සංවර්ධන වැඩසටහන්**

## (3.1) ව්‍යාප්ති සහනාධාර වැඩසටහන

### (3.1.1) ශ්‍රී ලංකාවේ කජු වගාවේ සංයුතිය




| | | | |
|---|---|---|---|
| * | දි.ආ.ව.ඒ. | - | දිවි නැගුම' ආර්ථික වගා ඒකක |
| | දි.ආ.දි.ප්‍ර.න. | - | දිළිඳු ජනතාවගේ ආර්ථිකය දියුණු කිරීමේ හා ප්‍රජාව නගා සිටුවීමේ ව්‍යාපෘතිය |
| | ප්‍රා.ආ. ස.වැ. | - | ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන වැඩසටහන - මාතලේ දිස්ත්‍රික්කය |
| | උ.ගැ.පු.දෙ. | - | උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ ව්‍යාපෘති |

## (3.1.2) කජු වගාව ව්‍යාප්ත කිරීම හා ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම

### (3.1.2.1) වගා වපසරිය වැඩිකිරීම

ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත සමස්ත කජුවගා භූමි ප්‍රමාණය අක්කර 129608 කි. 2014 වර්ෂයේදී දිස්ත්‍රික්ක 18 ක සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 125 ක් ආවරණය වන පරිදි බද්ධ කජු අක්කර 2500 ක් හා බීජ කජු අක්කර 2000 ක් වගා කරන ලදී. ඒ යටතේ ප්‍රතිලාභී පවුල් 4397 ක් සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත.

**කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය**

| දිස්ත්‍රික්කය | බද්ධ කජු (අක්කර) | බීජ කජු (අක්කර) |
|---|---|---|
| 01. පුත්තලම | 450 | - |
| 02. කුරුණෑගල | 450 | - |
| 03. හම්බන්තොට | 275 | - |
| 04. අනුරාධපුරය | 400 | - |
| 05. අම්පාර | - | 400 |
| 06. බදුල්ල | 125 | - |
| 07. මහනුවර | 25 | - |
| 08. රත්නපුර | 25 | - |
| 09. මාතලේ | 175 | - |
| 10. පොළොන්නරුව | 125 | - |
| 11. මොණරාගල | 300 | - |
| 12. මඩකලපුව | 50 | 450 |
| 13. ත්‍රිකුණාමලය | 50 | 450 |
| 14. වවුනියා | 25 | 150 |
| 15. මන්නාරම | - | 150 |
| 16. මුලතිව් | 25 | 200 |
| 17. කිළිනොච්චි | - | 150 |
| 18. යාපනය | - | 50 |
| **එකතුව** | 2500 | 2000 |

**(3.1.2.2) ගොවීන්හට සහනාධාර ගෙවීම් සිදුකිරීම**

බද්ධ කජු වගාකිරීම සඳහා අක්කරයකට රු.9,500/- ක් සහ බද්ධ කජු වගාව සඳහා යෝග්‍ය නොවන ප්‍රදේශවල බීජ කජු වගාකිරීම අක්කරයකට රු.3,500/- ක සහනාධාරයක් ගෙවනු ලැබේ.

**(3.1.2.3) ව්‍යාප්ති සෙවා පුළුල් කිරීම**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වගා කටයුතු ආවරණය කිරීම සඳහා ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලයද, උතුරු පළාතේ කිලිනොච්චි, මුලතිව් හා යාපනය දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි උතුරු පළාත් ප්‍රාදේශීය කාර්යාලයද පිහිටුවීමට කටයුතු කරන ලදී. විශෙෂයෙන්ම කිලිනොච්චි, යාපනය සහ මුලතිව් දිස්ත්‍රික්කවල කජු වගා සහනාධාර වැඩසටහන යටතේ අක්කර 350 ක් ප්‍රතිලාභී පවුල් 300කගේ සහභාගීත්වයෙන් අළුතෙන් වගා කරන ලදී.

**(3.2) වතු සංවර්ධනය, පුනරුත්ථාපනය හා ඵලදායිතාවය වර්ධනය කිරීම**

**(3.2.1) කජු වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම**

**(3.2.1.1) රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

සංස්ථාවේ ශාක අභිජනන මධ්‍යස්ථානවල ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය යටතේ (GAP) උසස් නිෂ්පාදන තත්ත්වයන් පවත්වා ගනිමින් මව්බීජ මිලියන 1.3 ක් නිෂ්පාදනය කරන ලදී. බද්ධ පැළ හා බීජ පැළ නිෂ්පාදනය කිරීමේදී එම මව්බීජ හා මව්ගස් වලින් ලබාගත් රිකිළි 200000 ක ප්‍රමාණයක් භාවිතා කරන ලදී.

| ශාක අභිජනන මධ්‍යස්ථානය | දිස්ත්‍රික්කය | භූමි ප්‍රමාණය (අක්කර) |
|---|---|---|
| 1. විලච්චිය | අනුරාධපුරය | 25 |
| 2. නාලන්ද | මාතලේ | 75 |
| 3. මහඔය | අම්පාර | 81 |
| 4. සුදුවතුර ආර | මොණරාගල | 50 |
| එකතුව | | 231 |

### (3.2.1.2) තවාන් කලමනාකරණය

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් වලින් ඉහළ ගුණාත්මයෙන් යුතු නව ප්‍රභේද වලින් සමන්විත බද්ධ පැළ 465979 ක් නිෂ්පදනය කර, 'දිවි නැගුම' හා සහනාධාර වැඩසටහන සඳහා නිකුත් කරන ලදී.

2014 **වර්ෂයේ බද්ධ පැළ නිෂ්පාදනය**

| පැළ තවානේ නම | නිපදවන ලද බද්ධ පැළ |
|---|---|
| 1. කමන්දළුව | 217500 |
| 2. දඹුල්ල | 54719 |
| 3. මිහින්තලේ | 67860 |
| 4. අළුත්තරම | - |
| 5. කුඹුක්කන | 59800 |
| 6. හාඩි | 27000 |
| 7. චන්ද්‍රිකා වැව | 39100 |
| එකතුව | 465979 |

සහනාධාර යෝජනා ක්‍රමයට අවශ්‍ය බීජ පැළ 80000 ක් නිපදවීම සඳහා මඩකලපුව, ත්‍රිකුණාමලය, වවුනියා,මන්නාරම, මුලතිව්, කිළිනොච්චි, යාපනය හා අම්පාර දිස්ත්‍රික්කවල පැළ තවාන් 51 ක් ස්ථාපනය කරන ලදී.

## (3.2.1.3) වතුයායන්වල නව වගාව

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පුත්තලම, කමන්දළුව, එළුවන්කුලම, හාඩි, ඔයාමඩුව, මාන්කර්ණි, මඩකලපුව යන වතුයායන්වල විශාල වශයෙන් සංවර්ධන කටයුතු සිදුකල අතර, අක්කර 500 ක පමණ නව වගාව සිදුකරන ලදී. මෙම වැඩසටහන් වලදී, විශෙෂයෙන්ම උතුරු පලාතේ පිහිටි කොණ්ඩච්චි වතුයායේ හා නැගෙනහිර පලාතේ පිහිටි මාන්කර්ණි වතුයාය සංවර්ධනය කිරිම සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ලබාගන්නා ලදී. මෙම වගා කටයුතු සඳහා තාක්ෂණික සහයෝගිතාවය හා කජු පැළ, සංස්ථාව විසින් ලබාදෙන ලදී. සංස්ථාවේ සෘජු අධික්ෂණය යටතේ කොණ්ඩච්චි වතුයාය තුල අක්කර 100 කින් සමන්විත ශාක අභිජනන උද්‍යානයක් ආරම්භ කිරීමටද කටයුතු කරන ලදී. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පුනරීන් හි පිහිටි වතුයායන් ශ්‍රී ලංකා යුධ හමුදාව භාරයේ පවතින අතර එම වතුයායන්වල නඩත්තු කටයුතු සඳහා උපදේශාත්මක සෙවාවන් අඛණ්ඩව ලබාදෙන ලදී. මීට අමතරව සංස්ථාව සතු පරිණත කජු වගා අක්කර 2500 ක පමණ ප්‍රමාණයක වගා පුනරුත්ථාපන කටයුතු සිදුකරන ලද අතර, වතුයායන් සඳහා රසායනික පොහොර හා පලිබෝධ මර්ධනය සඳහා කෘෂිරසායනික ලබාදෙන ලදී.

## (3.2.1.4) ඵලදායිතාවය වැඩි දියුණු කිරීම

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අනුග්‍රහයෙන් කුඩා කජු ඉඩම් හිමියන් සඳහා ‘ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද (GAP) භාවිතයෙන් කජු වගාවේ ඵලදායිතාවය ඉහල නැංවීම’ යන මැයෙන් වැඩසටහන් 10 ක් පවත්වන ලදී. මේ සඳහා පුත්තලම, කුරුණෑගල, ත්‍රිකුණාමලය, මුලතිව්, අනුරාධපුර යන දිස්ත්‍රික්කවල කුඩා කජු ඉඩම් හිමියන් 450 ක් සහභාගී විය. මීට අමතරව ගොවි පවුල් 2250 ක් සඳහා කජු වගාව, පලිබෝධ මර්ධනය, පොහොර භාවිතය හා පසු අස්වනු තාක්ෂණය යන මාතෘකා යටතේ පුහුණු වැඩසටහන් 91ක් පවත්වා ඇත.

## (3.3) අලෙවි හා පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය

### (3.3.1) පසු අස්වනු තාක්ෂණ සංවර්ධනය

#### (3.3.1.1) ගොවීන්ගෙන් ලෙලිකජු මිලට ගැනීම

වෙළඳපොල තරඟකාරී තත්ත්වයන් යටතේ කජු ගොවීන්වෙත ලෙලිකජු කිලෝ ග්‍රෑම් 01 සඳහා රු 250/- ක් දක්වා මුදලක් ලැබෙන පරිදි ලෙලිකජු කිලෝග්‍රෑම් 81000 ක් සංස්ථාව විසින් මිලට ගන්නා ලදී. මෙනිසා තරඟකාරී වෙළඳපොල මිල පරාසයක් ස්ථාපිත විය. මෙම වර්ෂයේ සංස්ථා වතුයායන්ගෙන් ලැබුණු මෙට්‍රික් ටොන් 115.0 ක අස්වැන්නද සංස්ථා කර්මාන්තශාලාවල පිරිසැකසුම් කරන ලදී.

#### (3.3.1.2) කජු පිරිසැකසුම් කර්මාන්තය ශක්තිමත් කිරීම

උසස් ප්‍රමිතියෙන් යුක්ත වූ කජු මද නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීම මගින් ඉහල මිලක් උපයාගැනීම පිණිස උසස් නිෂ්පාදන යාන්ත්‍රණයක් අත්‍යාවශ්‍ය වේ. මෙම වැඩසටහනට අනුකූලව කජු පිරිසැකසුම් කරුවන් සඳහා විජලන යන්ත්‍ර හා විදුලි බලයෙන් ක්‍රියාත්මක කරන කජු කැපීමේ යන්ත්‍ර ලබාදීම, ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද භාවිතයෙන් (GMP) හා අගය එකතු කිරීම හා ප්‍රමිති තත්ත්වයන් සම්බන්ධව පිරිසැකසුම් කරුවන් පුහුණු කිරීමත්, පිරිසැකසුම් සමිති සඳහා මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා සහායවීම හා වෙළඳපොල ප්‍රවර්ධනය සඳහා සහාය ලබාදීම සිදුකරන ලදී. මේ සඳහා නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පුහුණු මධ්‍යස්ථානය උපයෝගී කරගන්නා ලදී.

(3.3.2) **කජු අතුරු නිෂ්පාදන සංවර්ධනය**

**(3.3.2.1) කජු පුහුලන් භාවිතයෙන් බීම නිපදවීම**

ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් කජු පුහුලන් භාවිතකර පලතුරු බීම (Beverage) නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය සමඟ නිෂ්පාදන සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරයි.

**(3.3.3) කජු පිරිසැකසුම් කිරීම හා අලෙවිකරණය**

සංස්ථාවට අයත් කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන පුත්තලම හා නැඳගමුව (ගම්පහ දිස්ත්‍රික්කය) පිහිටා ඇත. සංස්ථා වතුයායන්ගෙන් හා ගොවින්ගෙන් මිලදී ගන්නා ලද ලෙලිකජු පිරිසැකසුම් කර, අගය එකතු කරන ලද කජු මද කොල්ලුපිටිය හා රාජගිරියේ පිහිටි සංස්ථා අලෙවි සැල් උපයෝගී කරගෙන අලෙවිකරණ ලදී.

මීට අමතරව වරලත් අලෙවිසැල් 18 ක් උපයෝගී කරගෙන අගය එකතු කරන ලද නව නිෂ්පාදන 04 ක් සහිත කජු නිෂ්පාදන පාරිභෝගිකයන් වෙත අලෙවි කරන ලදී. නව තාක්ෂණික ක්‍රම භාවිතය හා අගය එකතු කිරීම හා උසස් කජු නිෂ්පාදන අලෙවි කිරීම මගින් රු. මිලියන 63.33ක මුදලක් උපයා ගැනීමට සංස්ථාව සමත්විය.

(3.3.4) **කජු නිෂ්පාදන අපනයනය හා විදේශ විනිමය ඉපැයීම**

**(3.3.4.1)** වර්ෂ 2014 දී උසස් තත්ත්වයේ කජු මද හා අගය එකතුකරන ලද කජු මද මෙට්‍රික් ටොන් 129.4 ක් ජාත්‍යන්තර වෙළඳපොළට ඉදිරිපත් කිරීම මගින් රු. මිලියන 185.8 ක විදේශ විනිමය ඉපැයිමට ශ්‍රී ලංකාව සමත්විය. 2013 වර්ෂයේ අගය එකතුකරන ලද කජු මද මෙට්‍රික් ටොන් 51ක් අපනයනය කිරීමෙන් රු. මිලියන 77ක විදේශ විනිමයක් උපයා ගෙන ඇත. මේ අනුව 2013 වර්ෂයට සාපේක්ෂව අපනයන ධාරිතාවයේ හා විදේශ විනිමය ඉපැයිමේ වැඩිවීමක් 2014 දී පෙන්නුම් කර ඇත.

### (3.3.5) කජු ආනයනය

### (3.3.5.1) දේශීය පරිභෝජනය සඳහා ආනයනය

දේශීය වශයෙන් කජු පරිභෝජනය ඉහළ යාමත්, දේශගුණික විචල්‍යතා එනම් මල් හටගන්නා කාලසීමාව තුල අධික වර්ෂාපතනය ලැබීම නිසා අපේක්ෂිත කජු අස්වැන්න අඩුවීම සමඟම විශෙෂයෙන් ජනවාරි, පෙබරවාරි හා මාර්තු යන මාසවල කුඩා පරිමාණ කජු පිරිසැකසුම්කරුවන්ට අවශ්‍ය ලෙලිකජු දේශීය වෙළඳපොලතුල හිඟතාවයක් ඇතිවිය. මේ සඳහා විසඳුමක් වශයෙන් කුඩා පරිමාණ කජු පිරිසැකසුම්කරුවන් සඳහා බදු සහන යටතේ ලෙලිකජු ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදෙන ලදී. ශ්‍රී ලංකා රේගුවේ වාර්තාවලට අනුව, ලෙලිකජු මෙට්‍රික් ටොන් 1175 ක් ආනයනය කර කුඩා පරිමාණ නිෂ්පාදකයන් විසින් පිරිසැකසුම්කරුවන් රාශියක් අතර බෙදාහරින ලදී. මේ අනුව, කජු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන පවුල්වල ජීවනෝපාය ස්ථාවර කිරීම සඳහා සංස්ථාවට මැදිහත්වීමට අවස්ථාව ලැබුණි.

### (3.4) පර්යේෂණ හා සංවර්ධනය

ශාක අභිජනනය, පොහොර භාවිතය, කජු වගාවේ රෝග හා පලිබෝධ මර්ධනය, බද්ධ කිරීමේ විවිධ තාක්ෂණික ක්‍රම අත්හදා බැලීම, බද්ධ හා බීජ කජු වගාව, අස්වැන්න සහ අතුරුභෝග වගාව පිලිබඳ අඛණ්ඩ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන් වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සමඟ ඒකාබද්ව ක්‍රියාත්මක කරන ලදී. පර්යේෂණ හා කළමනාකරණ කමිටුව මගින් මෙම වැඩසටහන්වල ප්‍රගතිය ඇගයීම සිදුකරන ලදී. මෙම පර්යේෂණවල ප්‍රතිඵල ව්‍යාප්ති සෙවා ජාලය මගින් උපදේශන සෙවා ලබාදීමේදී මෙන්ම ක්ෂේත්‍ර ආදර්ශන, පත්‍රිකා,වීඩියෝ සහ රූපවාහිනී වැඩසටහන් මගින් ගොවීන්වෙත ලබාදෙන ලදී.

## (3.5) ‘දිවි නැගුම’ ‘දැයට කිරුළ’ සහ අනෙකුත් සංවර්ධන වැඩසටහන්

### (3.5.1) ‘දිවි නැගුම’ ජාතික සංවර්ධන වැඩසටහන

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ‘දිවි නැගුම’ ජාතික සංවර්ධන වැඩසටහනේ ගෙවතුවගා සංවර්ධන වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 13 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 41 ක් ආවරණය වන පරිදි ප්‍රතිලාභී පවුල් සඳහා බද්ධ පැළ 178213 හා බීජ පැළ 118236 ක් නිෂ්පාදනය කර බෙදාදී රෝපණය කිරීමට කටයුතු කර ඇත.

### (3.5.2) ‘දැයට කිරුළ’ ජාතික ප්‍රදර්ශනය

‘දැයට කිරුළ’ ජාතික ප්‍රදර්ශනය පැවැත්වූ කාලසීමාවතුල සංස්ථාව විසින් සපයනු ලබන සෙවාවන් සහ කජු නිෂ්පාදන ඇතුලත් අලෙවිසැලක් සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ප්‍රදර්ශන කුටිය තුල ඉදිරිපත් කරන ලදී.

## (4.0) <u>අයවැය</u>

(4.1)

| වර්ගය | අරමුදල් ආයෝජනය - 2014 (රු. මිලියන) | | |
|---|---|---|---|
| | රාජ්‍ය ආයෝජන | උපයාගත් අරමුදල් | එකතුව |
| ප්‍රාග්ධන වියදම් | 50.0 | 35.0 | 85.0 |
| පුනරාවර්තන වියදම් | 50.0 | 55.0 | 105.0 |
| **එකතුව** | 100.0 | 90.0 | 190.0 |

### (4.2) <u>වාණිජමය කාර්යයන් තුලින් 2014 වර්ෂයේ ඉපැයීම්</u>

(රු. මි)

| | | |
|---|---|---|
| කජු මද අලෙවිය | - | 63.33 |
| කජු මව් බීජ හා පැළ අලෙවිය | - | 50.87 |
| පොල් අලෙවිය | - | 1.17 |
| **එකතුව** | | 115.37 |

## (5.0) පරිපාලන කටයුතු

(5.1) කුඩා කජු ඉඩම් හිමියන්, කජු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන්නන් හා පාරිභෝගිකයන් වෙත ගුණාත්මක හා කාර්යක්ෂම සෙවාවක් ලබාදීමේ අරමුණ ඇතිව විධිමත් කලමනාකරණ භාවිතයන් සිදුකිරීමට හැකියාව ලැබුණි. රාජ්‍ය ව්‍යවසායක් ලෙස සෙවාවන් සපයන අතර, ලාභ ඉපැයීමද අරමුණුකර ඇති බැවින් සංස්ථාවේ සියළුම පාර්ශවකරුවන්ගේ සහාය මේ සඳහා ලබාගත හැකිවිය.

මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී, සහකාර සාමාන්‍යාධි කාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ සහායද නොමඳව ලැබුණි. රජයේ නව සංවර්ධන උපායමාර්ගවලට අනුකූලව ජනතාවගේ ආදායම් උත්පාදනය හා සංස්ථාවේ අරමුණු මුදුන්පත් කරගැනීම සඳහාද, මේ අනුව කටයුතු කලහැකි විය.

සංස්ථාවේ නව සංවිධාන ව්‍යුහය, බඳවාගැනීමේ හා උසස්වීමේ පරිපාටීන් ප්‍රතිසංවිධානය කිරීමට අදාල යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලැබුණි.

## (5.2) 2014-12-31 දිනට කාර්යය මණ්ඩලයේ තත්ත්වය

| **අනුමත කාර්ය මණ්ඩලය** | 2014-12-31 දිනට |
|---|---|
| ඉහළ කළමනාකරණ ශ්‍රේණිය | 02 |
| කළමනාකරණ ශ්‍රේණිය | 06 |
| විධායක ශ්‍රේණිය | 17 |
| කළමනාකරණ සහකාර ශ්‍රේණිය | 103 |
| සුළු ශ්‍රේණිය | 60 |
| **මුළු ගණන** | 188 |

මෙයට අමතරව සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථාන, වතුයායන්, ශාක අභිජනන මධ්‍යස්ථාන හා මධ්‍යම පැළ තවාන් වල මාසික අවශ්‍යතා මත චෙක් රෝල් කම්කරුවන් 350 ක් පමණ සෙවයේ යොදවා ඇත.

## (6.0) ජයග්‍රහණ

වර්ෂ 2012 දී හා 2013 දී වාර්තාගත වූ අලෙවි කාර්යයන් මගින් ලාභ ලබන තත්ත්වය වර්ෂ 2014 දී අඛණ්ඩව පවත්වාගැනීමට සමත්විය. මේ සඳහා සංස්ථාවේ වාණිජමය හා පැළ නිෂ්පාදන ක්‍රියාකාරකම් උපයෝගි කරගත් අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායි හා කාර්යක්ෂම මග පෙන්වීම හා කාර්යය මණ්ඩලයේ කැපවීම මේ සඳහා හේතු සාධක විය.

වාණිජමය ක්‍රියාකාරකම් මගින් 2014 වර්ෂය තුලදී සංස්ථාව උපයනු ලැබූ ශුද්ධ ලාභය රුපියල් මිලියන 20.5 කි. පහත සඳහන් බාධක නිසා අත්පත් කරගත් ලාභය මීට වඩා ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකියාව නොලැබුණි.

★ අයහපත් කාලගුණ තත්ත්වයන් මත එනම් මල් හටගන්නා කාලසීමාව තුල අධික වර්ෂාපතනය ලැබීම නිසා වතුයායන් වල අස්වැන්න අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීම.

★ දේශීය ලෙලිකපු ඉල්ලුමට සරිලන සැපයුමක් වාර්තා නොවීම නිසා කපු නිෂ්පාදනවලට ඉහළ මිලගණන් නියම වීම.

★ කම්කරු වියදම් හා ද්‍රව්‍ය වියදම් ඉහළ යාම.

★ පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදානයන් සීමාකිරීම හේතුවෙන් නව කාර්යයන් ආරම්භ කිරීමේදී මෙන්ම අත්‍යාවශ්‍ය සේවාවන් ඉටුකර ගැනීමේදී බාධා පැමිණුනි. මේ අනුව මෙම කාර්යයන් අඛණ්ඩව සිදුකර ගැනීම සඳහා සංස්ථාව විසින් උපයාගත් අරමුදල් උපයෝගී කර ගැනීමටද සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වාණිජමය හා සංවර්ධන කාර්යයන්හි ආයෝජනය සඳහා අරමුදල් හිඟතාවය ඇතිවිය.

## (7.0) ස්තුතිය

2014 වර්ෂය තුලදී ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සියළුම සෙවාවන් සැපයීම සහ වාණිජ කටයුතු ඉතා සතුටුදායක අන්දමින් පවත්වාගෙන යාමට හැකිවූ අතර, ඒ සඳහා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත  දක්වන ලද සහයෝගීතාවය පිළිබඳව මාගේ හෘදයාංගම ස්තුතිය හා ප්‍රණාමය ඔවුන්වෙත පුද කරමි.

විශෙෂයෙන්ම සංස්ථාවේ සියළුම ක්‍රියාකාරකම් ඉහළ ඵලදායිතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුතුව පවත්වාගෙන යාම සඳහා සාමාන්‍යාධිකාරීවරයා, සහකාර සාමාන්‍යාධිකාරීවරුන් ඇතුළු සියළු කාර්ය මණ්ඩලය දැඩි කැපවීමකින් යුතුව කටයුතුකල අතර, ඔවුන්ගේ සෙවයද අගය කරමි.

කුඩා පරිමාණයේ පිරිසැකසුම්කරුවන්, කජු නිෂ්පාදන අපනයනකරුවන්, කුඩා කජු ඉඩම්හිමියන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සියළුම පාර්ශවකරුවන් මා වෙත දක්වන ලද සහයෝගය සහ කැපවීම මත මෙම සාර්ථකත්වය ලඟාකර ගැනීමට හැකිවූ අතර, එයද අගය කරමි.

හිටපු සුළු අපනයන භෝග ප්‍රවර්ධන ගරු අමාත්‍ය රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා ඇතුළු එම අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා වර්තමාන වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු  ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය විසින් අපවෙත ලබාදුන් මග පෙන්වීම වෙනුවෙන්ද ස්තුතිවන්ත වෙමි.

**පී. ආර් .ජී. එල්. සී. විජේවර්ණසූරිය**

**සභාපති**

**ශ්‍රී ලංකා කජු සංස්ථාව**

# <u>අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව</u>

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය පකාශන ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මේ සමග ඉදිරිපත් කරමි.

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2003 ජූනි මස 2 වනදා නිකුත් කල චකලේඛ අංක පීඊඩී/12 ට අනුව ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය පකාශන 2015 පෙබරවාරි 28 වන දිනට පෙර විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

**ආරම්භය**

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනතේ 2 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ අංක 60/7 දරණ ගැසට් නිවේදනය මගින් 1973 මැයි 25 දින ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හා එවකට වැවිලි කර්මාන්ත අමාත්‍යතතුමාගේ නියෝගය මත රුපියල් මිලියන 40 ක මූලික පග්ධනයකින් යුක්තව ශ්‍රී ලංකා කජු සංස්ථාව පිහිටුවන ලදී.

**පතිඵල**

පවර්ථන වසරෙහි මූල්‍ය පතිඵල සහ ස්කන්ධය වෙනස් වීම පිලිබඳ දත්ත ස්කන්ධය වෙනස් වීමේ පකාශනය හා මූල්‍ය පකාශන මගින් අනාවරණය කර ඇත.

**ව්‍යාපාර සමාලෝචනය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය තත්ත්ව පකාශනයෙහි දක්වා ඇති අතර ඒ පිලිබඳ ඇගයීමක් සභාපතිතුමාගේ වාර්තාවෙහි ඇතුලත් කර ඇත.

**දේපල පිරියත හා උපකරණ**

මූලා පකාශනයෙහි පවර්ථන වසරට අදාලව දේපල පිරියත හා උපකරණ වල සිදු වූ වෙනස්කම් සටහන් අංක 1 මගින් පැහැදිලි කර ඇත. මෙම සටහනෙහි පෙන්වන වටිනාකම් ඒවායේ වර්තමාන වෙළඳපොල අගය හා පමාණාත්මක වෙනස්කම් නොපවතී.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරිම හා අලෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමට අමාතාවරයාට උපදෙස් දීම.

- කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ කටයුතු කිරීම.

- කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම දියුණු කිරීමේ පරමාර්ථයෙන් විමර්ශන හා පර්යේෂණ කටයුතු සිදුකිරීම.

- කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ තාක්ෂණික, අලෙවි හා වෙනත් තොරතුරු රැස් කිරීම, පිළියෙල කිරීම, ප්‍රසිද්ධ කිරීම සහ බෙදා හැරීම සහ ඒ කටයුතු වලදී අන් අය සමඟ එක්ව ක්‍රියා කිරීම.

- කජු සහ කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා පිහිටුවනු ලබන කර්මාන්තශාලා පිහිටුවිය යුතු ස්ථාන, ඒවායේ ප්‍රමාණය හා තාක්ෂණික ප්‍රමිති නිෂ්චය කිරීම සහ අලූත් කර්මාන්තශාලා පිහිටුවීමටත් අවශ්‍ය අවස්ථා වලදී එවකට පවතින කර්මාන්තශාලා ක්‍රියා කරවීම.

- කජු සහ කජු නිෂ්පාදන මිලට ගැනීම, බෙදා හැරීම, විකිණීම සහ අපනයනය කිරීම.

- කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම පිනිස පහසුකම් සැපයීම.

- කජු වගාවන්, පිරිසැකසුම් කිරීමේ පහසුකම් සහ අලෙවි කිරීම දියුණු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මූලික සංවිධානය පිහිටුවීම සහ ඒවා පිහිටුවීමට ආධාර දීම.

- කජු නිෂ්පාදන ප්‍රචාරය කිරීම හා විකිණීම සඳහා අවශ්‍යයැයි සලකනු ලබන පියවර ගැනීම, ලෝකයේ වෙළඳපොලවල්වල ඒ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලූම ප්‍රවර්ධනය කිරීම සහ ඒ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාර්යයන් සඳහා ප්‍රචාරක කටයුතුවලට මුදල් යෙදවීම, ඒ කටයුතු අනුපාලනය කිරීම සහ ඒ කටයුතුවලට අධාරදීම ආරම්භ කොට ඊට අනුග්‍රහ දැක්වීම.

**සංචිත**

ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය තුල සංස්ථාවේ මුලූ සංචිත වල සංයුතිය සඳහන්ව ඇත.

**අධ්‍යක්‍ෂ මණ්ඩලය**

2014 දෙසැම්බර් 31 දින වන විට තේරී පත් වී සිටි සංස්ථාවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය පහත පරිදි වේ.

(1). 2014.01.01 දින සිට 2014.09.19 දින දක්වා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්.

| සාමාජිකයාගේ නම | තනතුර |
|---|---|
| 1. එස්. වීරකෝන් මහතා | සභාපති |
| 2. එච්.අයි. ගුණවර්ධන මහතා | නියෝජ්‍ය සභාපති |
| 3. එම්.ඩී. අබේගුණවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - මහා භාණ්ඩාගාර නියෝජිත |
| 4. පී.ආර්.ජී.එල්.සී. විජෙවර්ණසූරිය මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 5. එස්.ඒ.යූ. සිල්වා මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 6. ඒ.එම්. අම්බ්‍රාස් මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 7. කේ. විදානපතිරණ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

2014 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් : වී.යූ. ලියනගේ මහතා

(2) 2014.09.20 දින සිට පත්වූ සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්.

| සාමාජිකයාගේ නම | තනතුර |
|---|---|
| 1. පී.ආර්.ජී.එල්.සී. විජේවර්ණසූරිය මහතා | සභාපති |
| 2. කේ.පී.ජී. සිසිර කුමාරරත්න | නියෝජ්‍ය සභාපති |
| 3. එම්. අන්ද්‍රාහැන්දි මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - මහා භාණ්ඩාගාර නියෝජිත |
| 4. එස්.ඒ.යූ. සිල්වා මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

5. ටී.සී.එස්. ප්‍රනාන්දු මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

6. ආර්.එස්. කහවල මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

7. එස්.එල්. රණවීර මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2014 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් : වී.යූ. ලියනගේ මහතා

**විගණන කමිටුව**

රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට (Public Enterprises Guideline) අනුකූලව සංස්ථාවේ විගණන කමිටුව පිහිටුවා ඇත.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට සහ සෙවකටන්ට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසියාකාරව ගෙවා ඇත.

**පාරිසරික ආරක්ෂාව**

පරිසරයට අහිතකර කිසිදු ක්‍රියාකාරකමකට සංස්ථාව මැදිහත් වී නොමැත.

**මූල්‍ය තත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්**

ශෙෂ පත්‍ර දිනට පසු ගිණුම් මගින් ගැලපීම් කිරිමට හෝ හෙළිදරව් කිරීම සඳහා කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.

**විගණකවරු**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන රජයේ විගණකාධිපති විසින් විගණනය කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මත.

**වී.යූ. ලියනගේ**
**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

## විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

2005.07.01 දිනැති අංක 31 දරණ (PED 31) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව හා එම චක්‍රලේඛයට අදාලව වරින්වර සිදුකරන ලද සංශෝධනයන් වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අංක 51, 53 හා 55 යන චක්‍රලේඛයන් (PED 51, PED 53 හා PED 55 මඟින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව ශ්‍රී ලංකා කප්‍රු සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කරන ලද අතර, එය සාමාජිකයන් හත් දෙනෙකුගෙන් හා එක් නිරීක්ෂකයෙකුගෙන් යුක්ත සමස්තය. 08 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් විය.

අදාල කමිටුවේ සභාපතිවරයා ලෙස මූල්‍ය කටයුතු පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ද, කමිටුවේ ලේකම්වරයා ලෙස මෙම සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් / සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන ද කටයුතු කරන ලදී.

2014 වර්ෂය හා අදාලව පවත්වන ලද සමස්ත විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ගණන 03 ක් වූ අතර, එම රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ හා නිරීක්ෂකයන්ගේ සහභාගීත්වය පහත පරිදි විය.

| | | | | |
|---|---|---|---|---|
| 01. | එස්. උපේන්ද්‍ර සිල්වා මහතා<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2014.11.28 දින සිට | : | කමිටු සභාපති | 3/3 |
| 02. | එම්. අන්ද්‍රාහැන්නදි මහත්මිය<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2014.12.19 දින සිට<br>(මහා භාණ්ඩාගාර නියෝජිත) | : | කමිටු සාමාජික | 1/3 |
| 03. | ටී.එස්. සුගත් ප්‍රනාන්දු මහතා<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2014.11.28 දින සිට | : | කමිටු සාමාජික | 3/3 |
| 04. | ඩී.කේ. ජයකොඩිආරච්චි මහතා<br>සාමාන්‍යාධිකාරි | : | කමිටු සාමාජික | 3/3 |
| 05. | එම්.ටී.එස්.කේ. පීරිස් මහතා<br>සහකාර සාමාන්‍යාධිකාරී - මුදල් | : | කමිටු සාමාජික | 3/3 |

06. පී.බී. කොඩිකාර මහතා : කමිටු සාමාජික 2/3

සහකාර සාමාන්‍යාධිකාරී - මානව/පාලන - 2014.12.05 දින සිට

07. ජී.බී.බී. සුරේන්ද්‍ර මහතා : කමිටු සාමාජික 1/3

වැ.බ.ස. සාමාන්‍යාධිකාරී - මානව/පාලන 2014.11.28 දින සිට 2014.12.05 දින දක්වා

08. වී.යූ. ලියනගේ මහතා : කමිටු ලේකම් 3/3

සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන හා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

09. ඒ.පී.ජී. අතුකෝරාළ මහත්මිය : කමිටු නිරීක්ෂක 3/3

විගණන අධිකාරී (විගණකාධිපති දෙපාර්තමේන්තුව)

2014 වර්ෂය තුලදී පවත්වන ලද පළමු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ඉදිරි වර්ෂය සඳහා එනම් 2015 වර්ෂය සඳහා පිළියෙල කරන ලද සංස්ථාවේ ප්‍රග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් ඇස්මේන්තුවේ අන්තර්ගතය හා 2015 වර්ෂය සඳහා පිළියෙල කරන ලද සංස්ථාවේ ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගතය සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කරුණු සමාලෝචනය කරන ලද අතර, මෙහිදී මහා භාණ්ඩාගාරයෙන් අනුමත වී ඇති පුනරාවර්තන ප්‍රදාන හා ප්‍රග්ධන ප්‍රදාන වටිනාකම අනුව සංස්ථාවේ ක්‍රියාත්මක සැලැස්ම ක්‍රියාවට නැංවීමේදී වැය කළ යුතු වියදම් සඳහා සංස්ථාව මඟින් උපයාගන්නා අරමුදල් භාවිතා කළ යුතු ආකාරය සම්බන්ධයෙන් ද විශෙෂ සාකච්ඡාවක් සිදුකරන ලදී. ඒ අනුව 2015 වර්ෂයේ ප්‍රග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් ඇස්තමේන්තුව හා එම වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පිණිස කමිටුව මඟින් නිර්දේශ කරන ලදී.

සමාලෝචිත වර්ෂය හා අදාලව පවත්වන ලද දෙවන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී 2014 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා පිළියෙල කර ඉදිරිපත් කර තිබූ සංස්ථාවේ සමස්ත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අදාල මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය පිළිබඳ වාර්තාවේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් කමිටුව මඟින් දීර්ඝ වශයෙන් කරුණු සමාලෝචනයක් සිදු කරන ලද අතර, පසුව අදාල වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පිණිස නිර්දේශ කිරීම සිදුවිය.

එමෙන්ම 2014.11.30 දින දක්වා (එනම් මාස 11 ක් සඳහා) සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් නිකුත් කර තිබූ අභ්‍යන්තර විගණන වාර්තාවල අන්තර්ගත නිරීක්ෂණයන් හා එම නිරීක්ෂණ සම්බන්ධයෙන් පාලනාධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ද කමිටුව මඟින් සමාලෝචනයක් සිදුකරන ලදී. අදාල සමාලෝචනයේදී  කජු පිරිසැකසුම් කටයුතුවලදී ඒ හා අදාල ජාතියන්ත්‍රර ප්‍රමිතීන් භාවිතා කිරීමේ අවශ්‍යතාවය. කජු පිරිසැකසුම් ක්‍රියාවලියේ යෙදවුම් හා නිමවුම් අනුපාතය හා පිරිසැකසුම් ක්‍රියාවලියේදී හඳුනාගන්නා අපතයන් පිළිබඳව විශ්ලේෂණය, සංස්ථා අලෙවි අංශයේ වෙළෙඳ කාර්ය මණ්ඩලය සඳහා අලෙවි කටයුතු සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබාදීම, කජු අලෙවිසැල්වල තොග ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම, කජු වගාව සඳහා දැනට ක්‍රියාත්මක වන සහනාධාර ගෙවීම් ක්‍රමවේදය විශ්ලේෂණාත්මක ඇගයීම, සංස්ථා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කටයුතු විශ්ලේෂණාත්මකව ඇගයීම සඳහා කාලීන රැස්වීම් පැවැත්වීම හා සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ දෛනික සේවය සඳහා පැමිණීම්, පිටවයාම් හා නිවාඩු ලබා ගැනීම් සම්බන්ධ ලේඛන පවත්වා ගැනීම විධිමත් කරලීම යන කරුණු සම්බන්ධයෙන් ඉදිරියේදී විශෙෂ අවධානය යොමු කර කටයුතු කිරීමට කමිටුව විසින් තීරණය කරන ලදී.

2014 වර්ෂය හා අදාලව පැවැත්වූ තුන්වන හා අවසාන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී 2015 වර්ෂය සඳහා පිළියෙල කරන ලදුව කමිටුව වෙත ඉදිරිපත් කර තිබූ සංස්ථාවේ අභ්‍යන්තර විගණන සැලැස්මේ අන්තර්ගතය සම්බන්ධයෙන් කමිටුව විසින් දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කළ අතර, ඒ අනුව අදාල අභ්‍යන්තර විගණන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පිණිස නිර්දේශ කරන ලදී.

එස්. උපේන්ද්‍ර සිල්වා
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

# ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 1. 2014 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව

## 01. කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය හා සංවර්ධන වැඩසටහන්

### 1.1 කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය

භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය යටතේ මෙම වර්ෂය තුල බද්ධ කජු අක්කර 2200 ක් හා බීජ කජු අක්කර 2000 ක් වශයෙන් මුළු අක්කර 4200 ක් දිස්ත්‍රික්ක 18 ක් ආවරණය වන පරිදි වගාකර ඇත. ගොවි පවුල් 4397 ක් සඳහා මෙමගින් ප්‍රතිලාභ ලැබුණි. මේ සඳහා වැයවුණු මුළු වියදම රු.මිලියන 20.5 කි.

### 1.2 'දිවි නැගුම' ජාතික සංවර්ධන වැඩසටහන

ගෙවතු වගා වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 13 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 41 ක් සඳහා බද්ධ පැළ 164521 ක් හා බීජ පැළ 95111 ක් නිකුත්කර ඇත. මෙමගින් සංස්ථාව වෙත ලැබුණු ආදායම රු මිලියන 38.0කි.

### 1.3 'දැයට කිරුළ' ජාතික සංවර්ධන වැඩසටහන

2014 වර්ෂයේදි කුලියාපිටියේදි පැවැත්වූ 'දැයට කිරුළ' ජාතික ප්‍රදර්ශනයේදී සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශ ප්‍රදර්ශන කුටියතුල සංස්ථාව විසින් සපයනු ලබන සෙවාවන් සහ අලෙවි කුටියක් ඇතුලත් ප්‍රදර්ශන කුටියක් මගින් කජු වගාව සඳහා උනන්දුවන්නන් හට අවශ්‍ය සියළු උපදේශාත්මක සෙවා මුද්‍රිත මාධ්‍යයෙන් හා පර්යේෂණ නිලධාරීන් මගින් ලබාදීමට හැකිවිය. මේ සඳහා වැයවූ මුදල රු. මිලියන 0.55 කි.

## 02. වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම

### 2.1 රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

විවිධ ප්‍රදේශවලට උචිත නව ප්‍රභේද අභිජනනය කර කුඩා කජු ඉඩම්හිමියන්වෙත ලබාදීම සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්ද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය, අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය සහ මොණරාගල දිස්ත්‍රික්කයේ සූදුවතුරආර යන ශාක අභිජනන මධ්‍යස්ථාන නඩත්තුකරන ලදී. ව්‍යාප්ති සේවා සහ වාණිජමය කාර්යයන් සඳහා අවශ්‍ය බද්ධ පැළ නිෂ්පාදනය සඳහා අවශ්‍ය ඉහළ ගුණාත්මයෙන් සමන්විත මවුබීජ මිලියන 1.3 ක් හා අංකුර 200000 ක් මෙමගින් ලබාගන්නා ලදී. මේ සඳහා වැයවූ මුළු මුදල රු. මිලියන 5.8 කි.

### 2.2 නිෂ්පාදනය වැඩිදියුණු කිරිම

කජු වගාවේ රෝග හා පළිබෝධ මර්ධනය හා ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් (GAP) ඵලදායිතාවය ඉහළ නැංවිම සඳහා වැඩමුළු 10 ක් අනුරාධපුරය, මුලතිවු, පුත්තලම, කුරුණෑගල, මඩකලපුව, ත්‍රිකුණාමලය, මාතලේ, පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල පවත්වන ලදී. ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ මූල්‍යාධාර මත පවත්වනලද මෙම වැඩමුළු සඳහා කුඩා ඉඩම්හිමියන් 450 ක් සහභාගී විය. මේ සඳහා වැයවූ මුළු වියදම රු. මිලියන 0.2 කි.

### 2.3 පැළ තවාන් කලමනාකරණය

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් 07 ක් කමන්දළුව වතුයායේ හා අළුත්තරම, හාඩි, මිහින්තලේ, චන්ද්‍රිකාවැව, දඹුල්ල හා කුඹුක්කන පිහිටා ඇත. නවීන තාක්ෂණය උපයෝගී කරගෙන බද්ධ පැළ නිපදවීම සඳහා පොලිදැල් ගෘහ 06 ක් කමන්දළුව, මිහින්තලේ, මඩකලපුව, අළුත්තරම පැළ තවාන්වල ඉදිකර ඇත. මෙම තවාන්වල 2014 මහ කන්නය සඳහා උසස් තත්ත්වයේ බද්ධ පැළ 465979 ක් නිෂ්පාදනය කර ගොවීන්වෙත ලබාදෙන ලදී.

## 03. පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්

වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ශාක අභිජනනය, පොහොර භාවිතය, පැළ සනත්වය, කජු වගාවේ රෝග හා පළිබෝධ මර්ධනය, අතුරු භෝග වගාව, බද්ධ හා බීජ වගාවන්, බද්ධ කිරීමේ තාක්ෂණික ක්‍රමවේද අස්වැන්න පිළිබඳව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. අදාල පර්යේෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් වැඩමුළු සහ ව්‍යාප්ති සෙවාවන් මගින් ගොවීන් දැනුවත් කරනු ලැබේ. මේ සඳහා වැයවූ මුදල රු. මිලියන 2.42 කි.

## 04. සංස්ථා වතුයායන් නඩත්තු කිරීම හා වගා පුනරුත්ථාපනය

කොණ්ඩච්චි හා මාන්කර්ණි වතුයායන් සහ මුළු අක්කර 400 ක් පමණ අළුතින් වගාකටයුතු සිදුකරන ලදී. කොණ්ඩච්චි සහ මාණ්කර්ණි වතුයායන්වල මෙම වගා කටයුතු සිදුකිරීම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සිදුකරන ලදී. මීට අමතරව ප්‍රදේශයට උචිත නව ප්‍රභේද අභිජනනය කිරීම සඳහා කොණ්ඩච්චි වතුයායේ අක්කර 100 ක කැලෑව යන්ත්‍ර යොදා එළිපෙහෙලි කර ශාක අභිජනන උද්‍යානයක් ආරම්භ කරන ලදී.

වතුයායන්වලින් මෙට්‍රික් ටොන් 105.0 ක ලෙලිකජු අස්වැන්නක් ලැබුණි. මීට අමතරව ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස රසායනික පොහොර යෙදීම, වල් මර්ධන කටයුතු, රෝග හා පළිබෝධ මර්ධනය, ක්ෂේත්‍ර මාවත් නඩත්තු කිරීම, කප්පාදු කිරීම ආදී ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේදයන්ද භාවිතා කරන ලදී. මේ සඳහා වැයවූ මුළු මුදල රු. මිලියන 8.4 කි.

## 05. පසු අස්වනු තාක්ෂණය

### 5.1 අලෙවිකරණය හා පිරිසැකසුම් කර්මාන්ත ප්‍රවර්ධනය

වෙළඳපොල තරඟකාරී තත්ත්වයන් යටතේ ලෙලිකජු කිලෝග්‍රෑමයකට 250/- ක මුදලක් ලැබෙන පරිදි ලෙලිකජු කිලෝ 81000 ක් සංස්ථාව විසින් මිලට ගන්නා ලදි. මීට අමතරව කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන්ගෙන් කජුමද කිලෝ 3500 ක් මිලට ගන්නා ලදී. සංස්ථා වතුයායන්ගෙන් ලද අස්වැන්න සහ ගොවීන්ගෙන් මිලදීගත් ලෙලිකජු පුත්තලම සහ නැඳගමුවෙහි පිහිටි පිරිසැකසුම් මධ්‍යස්ථානවලදී පිරිසැකසුම් කරන ලදී. එවා අගය එකතුකල නිෂ්පාදන ලෙස සංස්ථාවේ ප්‍රධාන අලෙවිසැල් මගින් අලෙවිකරන ලදී. මේ සඳහා වරලත් අලෙවිසැල් 18 කින් සමන්විත සංස්ථා අලෙවිසැල් ජාලයක් උපයෝගි කරගන්නා ලදි. අගය එකතුකල නව නිෂ්පාදන 04 ක් පාරිභෝගිකයන් වෙත ඉදිරිපත්කල හැකිවූ අතර, ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රම භාවිතය (GMP) පිළිබඳව කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන් සහ අපනයනකරුවන් දැනුවත්කිරීම සහ පුහුණු කිරිම සිදුකරන ලදී. අලෙවි කටයුතු මගින් සංස්ථාව උපයන ලද මුළු ආදායම රු.මිලියන 63.33 කි.

## 06. මානව සම්පත් සංවර්ධනය

කජු පැළ බද්ධ කිරීමේ තාක්ෂණ ක්‍රමවේද හඳුන්වාදීම හා පුහුණු කිරිමේ වැඩසටහනක් මහියගණය මධ්‍යම පැළ තවානේ පවත්වන ලදී. දිස්ත්‍රික්ක 06 ක පුහුණුලාභීන් 14 ක් මේ සඳහා සහභාගී විය. මීට අමතරව කාර්යය මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන්ගේ වෘත්තිය කුසලතාවයන් සංවර්ධනය කිරිම පිණිස පුහුණු වැඩසටහන්වලට සහභාගී කරවන ලදී. මේ සඳහා වැයවූ මුළු මුදල රු. මිලියන 0.55 කි.

## ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත ප්‍රධාන මධ්‍යකාලීන ක්‍රියාමාර්ග කිහිපයකි.

01. **ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම**
02. **කජු වගා ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම**
03. **කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය**
04. **මානව සම්පත් සංවර්ධනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම.**

### 01. ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම

### 1.1 ව්‍යාප්ති වැඩසටහන් යටතේ කජු වගාව

ශ්‍රී ලංකාවේ කජු වගාව ප්‍රධාන වශයෙන් වියළි දේශගුණික කලාපය තුල ව්‍යාප්තව ඇත. පසුගිය දශක 03 ක කාලයක ක්‍රියාත්මක වූ යුධමය වාතාවරණය හේතුවෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පිහිටි කජු වගා බිම් අක්කර 30000 ක් පමණ විනාශ විය. එහෙත් වර්ෂ 2010 සිට සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාප්ති වැඩසටහන් යටතේ වර්ෂයකට අක්කර 10000 කට අධික ඉඩම් ප්‍රමාණයක් කජු වගාවට නැඹුරු කරවීමට සමත්විය.

භාණ්ඩාගාර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාප්ති සහනාධාර යෝජනා ක්‍රමය යටතේ බද්ධ හා බීජ කජු වගාව වර්ෂයකට අක්කර 4500 බැගින් ඉදිරි වසර 03 තුල ක්‍රියාත්මක කරනු ඇත.

### 1.2 වගා පුනරුත්ථාපනය

සංස්ථා වතුයායන් වල නව වගාව හා පැරණි වගා පුනරුත්ථාපනය කිරීම 2011 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී.මේ යටතේ උතුරු පළාතේ කොන්ඩච්චි වතුයාය, නැගෙනහිර පළාතේ මාණ්කර්නි වතුයාය සංවර්ධනය හා පුනරුත්ථාපන කටයුතු

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව ආරම්භ කරන ලදී. මේ යටතේ කොන්ඩච්චි හා මාන්කර්ණි වතුයායන්වල ඉදිරි වසර 3 තුලදී අක්කර 1000 ක් පමණ අළුතින් වගාකිරීමට සැළසුම් කර ඇත.

## 1.3 <u>නව වගාව</u>

කුඩා ඉඩම් හිමියන් සතු කජු වගාවන් වල නව වගාවද වාර්ෂිකව අක්කර 500 බැගින් සිදු කෙරෙන අතර, ඉදිරි වසර තුන තුල මෙම වගා නැඹුරුව අඛණ්ඩව පවතිනු ඇත. **ඉහත සියළු වගා වැඩසටහන් මගින් අවම වශයෙන් වාර්ෂිකව අක්කර 6000 බැගින් කජු වගා භූමි ප්‍රමාණය ඉහළ නැංවීමට කටයුතු කරනු ඇත.**

මෙම කාර්යයන් සං‍ාර්ථකව ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 10 කින් සමන්විත ව්‍යාප්ති සෙවා ජාලයක් ක්‍රියාත්මක කරනු ලබන අතර, දිස්ත්‍රික්ක 18 ක කජු වගා සංවර්ධන කටයුතු මෙමගින් ආවරණය කරනු ලබයි.

## 02. කජු වගා ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය අක්කර 129608 ක් පමණ වන අතර, මින් 88% ක් පමණ කුඩා ඉඩම් හිමියන් වේ. බහුතරයක් ඉඩම්වල බීජ කජු ගස් වගාකර ඇති අතර, සංස්ථා වතුයායන්වල මෙන්ම මෙම ඉඩම්වලද කජු ගස් වල වයස අවුරුදු 20-35 පමණ වන අතර, එක් ගසකින් ලෙලිකජු කිලෝ ග්‍රෑම් 3-5 ක් අතර ප්‍රමාණයක් ලැබේ. වැඩි දියුණු කරනලද නව කජු ප්‍රභේදවලින් සමන්විත කජු වගාවන් ඇති වියට්නාමය, ඉන්දියාව වැනි රටවල ගසකින් කිලෝ ග්‍රෑම් 10-15 ත් අතර අස්වැන්නක් ලැබේ. මේ අනුව වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරයි.

## 2.1 නව ප්‍රභේද හඳුන්වාදීම

මේ අනුව වැඩි අස්වැන්නක් ලබාදෙන වැඩිදියුණු කල නව ප්‍රභේද 08 ක් සංස්ථාව විසින් ගොවීන්වෙත හඳුන්වා දී ඇත. වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ කටයුතු සිදුකෙරෙන අතර, WUCC 1 WUCC 5, WUCC 8, WUCC 9, WUCC 13, WUCC 19, WUCC 21, WUCC 23 යන ප්‍රභේද 08 එළුවන්කුලම, විලච්චිය, නාලන්ද, මහඔය, සුදුවතුර ආර හා ඔයාමඩුව යන වතුයායන් හා ශාක අභිජනන මධ්‍යස්ථානවල වගා කර ඇත.මෙම මව්ශාක වලින් අංකුර ලබාගෙන දිවයිනේ විවිධ දේශගුණික කලාපවලට උචිත නව ප්‍රභේද අභිජනනය කර ගොවීන් වෙත ලබාදීමට කටයුතු කරනු ලැබේ. වාර්ෂිකව නව ප්‍රභේද 02 බැගින් හඳුන්වාදීමට කටයුතු කරන අතර, මෙමගින් හෙක්ටයාරයකට ලැබෙන අස්වැන්න කිලෝ ග්‍රෑම් 1000 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

## 2.2 ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය

ඉතා අඩු අස්වැන්නක් ලබාදෙන බීජ කජු ගස් ඉවත්කර නැවත වගාව සිදුකිරීම සඳහා කුඩා ඉඩම් හිමියන් වාර්ෂිකව යොමු කරනු ලැබේ. ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන්(Good Agricultural Practices) කජු වගාවේ අස්වනු ඵලදායිතාවය ඉහළ නැංවීම අරමුණු කර ජාතික වැවිලි කලමනාකරණ ආයතනයේ සහභාගීත්වය මත ගොවීන් පුහුණු කිරීමේ වැඩසටහන් වාර්ෂිකව සිදුකරනු ලැබේ. මෙය ඉදිරි වර්ෂ තුන තුලදීද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. දෘෂ්‍ය මාධ්‍ය මේ සඳහා උපයෝගී කරගනු ලැබේ. කජු ගස්වල මල් හටගන්නා කාලය තුල අධික වර්ෂාපතනය පැවතීම නිසා දළුමැරීමේ රෝගය ව්‍යාප්ත වේ.

මේ නිසා කජු අස්වැන්න 30%-40% ත් අතර ප්‍රමාණයකින් අඩුවේ. මේ සඳහා කුඩා ඉඩම් හිමියන් දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය වී ඇත. පරිණත කජු වගාවන් තුල ඇති කඳපණු හානිය මර්ධනය කිරීම සඳහා පර්යේෂණ අංශ සමඟ ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරන අතර මෙය ඉදිරි වර්ෂ තුන තුලදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

## 2.3 මධ්‍යම පැළ තවාන්

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් මිහින්තලේ, දඹුල්ල, කමන්දළුව වතුයාය, අළුත්තරම, කුඹුක්කන, හාඩි වතුයාය හා චන්ද්‍රිකාවැව යන ස්ථාන වල ස්ථාපිත කර ඇත. මෙම තවාන් මගින් නව ප්‍රභේද වලින් සමන්විත ඉහළ ගුණාත්මයෙන් යුක්ත බද්ධ පැළ සංස්ථා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ නිෂ්පාදනය කර ගොවීන් වෙත නිකුත් කරනු ලැබේ. වාර්ෂිකව බද්ධ පැළ 500000 ක් නිෂ්පාදනය කරන අතර, ඉදිරි වර්ෂ 03 තුලදීද වසරකට පැළ 500,000 ක් බැගින් නිපදවීම අරමුණු කර ඇත. පැළ නිෂ්පාදනයේදී නව තාක්ෂණය භාවිතය වැඩිදියුණු කෙරෙනු ඇත.

## 03. කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය

ශ්‍රී ලංකාවේ නිපදවන කජු මදවල රසවත් බව, විශාලත්වය හා ආවේණික වර්ණයෙන් යුක්ත වීම නිසා ලෝක වෙළඳපොල තුල අධික ඉල්ලුමක් ඇතිවී ඇත. එහෙත් වාර්ෂිකව නිෂ්පාදනය වන ලෙලිකජු මෙට්‍රික් ටොන් 10000-12000 ක පමණ වාර්ෂික අස්වැන්න මගින් මෙම අපනයන ධාරිතාවය ක්ෂණිකව ඉහළ නැංවීම දුෂ්කර වී ඇත. දේශීය මද පරිභෝජනයද ඉහළ ගොස් ඇත.

මීට අමතරව කජු මද කිලෝවක නිෂ්පාදන වියදම ඉහළයාම නිසා කජු මද කිලෝවක මිල රු. 1800/- ත් රු. 2400/- ත් අතර පරාසයක පවතී. මෙම කරුණු සැළකිල්ලට ගෙන කජු මද නිෂ්පාදනවල ගුණාත්මය හා ලාභය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත.

### 3.1 ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය

සංස්ථාව විසින් කුඩා පරිමාණ ව්‍යාවසායකයන් සඳහා ප්‍රමිතිකරණය, අගය එකතු කිරීම හා ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද (Good Manufacturing Practices) භාවිතයෙන් නිෂ්පාදනවල තත්ත්වය ඉහළ නැංවීම, සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය, නව තාක්ෂණය සහිතව පිරිසැකසුම් ක්‍රියාවලිය නවීකරණය කිරීම, අඩු වියදම්

විජලීකරණ යන්ත්‍ර භාවිතය හා නව ඇසුරුම් ක්‍රම හා නව නිෂ්පාදන සඳහා ව්‍යවසායකයන් උනන්දු කිරීම සිදුකෙරේ. මේ සඳහා නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පුහුණු මධ්‍යස්ථානය උපයෝගී කරගනු ලැබේ.

## 3.2 පුහුණු වැඩසටහන්

කුඩා පරිමාණ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රමිති තත්ත්වයන් දක්වා ඉහළ නැංවීමට සංස්ථාවේ දායකත්වය ලබාදුන් අතර, වාර්ෂිකව පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන්නන් 40 ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇත. මෙම ඉදිරි වසර 03 තුල අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

පිරිසැකසුම් කර්මාන්තය ආරම්භ කරන්නන් හට අවශ්‍ය විදුලිබලයෙන් ක්‍රියාකරන කැපීමේ යන්ත්‍ර (Shelling machine) හා විජලීකරණ යන්ත්‍ර (Ovens) සංස්ථාවේ මැදිහත්වීම මත පහසුමිලට ලබාදීමේ වැඩසටහනක්ද ක්‍රියාත්මක කෙරෙන අතර, මෙය අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

## 3.3 ගොවීන්ගෙන් ලෙලිකජු මිලට ගැනීම

සංස්ථා වතුයායන් වලින් ලැබෙන අස්වැන්නට අමතරව පිරිසැකසුම් කර්මාන්තශාලාවල අඛණ්ඩව වාර්ෂික නිෂ්පාදනය සිදුකිරීම සඳහා අවශ්‍ය ලෙලි කජු ගොවීන්ගෙන් මිලට ගැනීම පසුගිය වසර තුලදී සිදුකරන ලදී. සංස්ථාවේ ප්‍රාදේශීය කලමනාකරුවන් හා ව්‍යාප්ති නිලධාරීන් විසින් මෙම කාර්යය සිදුකරනු ලැබේ. මෙමගින් ගොවි නිෂ්පාදන වලට ඉහළ මිලක් ලැබුණු අතර, අතරමැදියන් විසින් ගොවීන්ගෙන් අඩුමිලට ලෙලිකජු මිලදී ගැනීම වැළැක්වුණු බැවින් ස්ථාවර මිලක් ගොවීන්ට ලබාගැනීමට හැකියාව ලැබුණි. ඉදිරි වර්ෂ 3 තුලදීද ලෙලිකජු ගොවීන්ගෙන් මිලට ගැනීමට කටයුතු කරනු ලැබේ. මීට අමතරව ගොවීන්ගෙන් කජු මද මිලදීගැනීමද සිදුකරන ලදී.

## 3.4 <u>කජු අතුරු නිෂ්පාදන ප්‍රවර්ධනය</u>

කජු අස්වැන්න මගින් ප්‍රධාන වශයෙන්ම ලෙලිකජු වෙන්කරගන්නා අතර කජු පුහුලන් ප්‍රයෝජනයට නොගෙන අපතේ යයි. මේ අනුව වාර්ෂිකව කජු පුහුලන් ටොන් 10,000කට අධික ප්‍රමාණයක් ප්‍රයෝජනයට නොගෙන විනාශ වී යයි.

සංස්ථාව විසින් කජු පුහුලන් භාවිතයෙන් වයින් නිපදවීම ආරම්භ කර ඇති අතර, ඒ සඳහා වයින් නිෂ්පාදනාගාරයක්(Winery) පුත්තලම කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ස්ථාපිත කර ඇත. මෙමගින් වාර්ෂිකව උසස් තත්ත්වයේ වයින් වාර්ෂිකව බෝතල් 4500 ක් නිෂ්පාදනය කිරීමටත්, එහි ප්‍රගතිය මත ඉදිරි වසර 3 තුල අඛණ්ඩව කජු පුහුලන් භාවිතයෙන් වයින් නිෂ්පාදනය කර වෙළඳපොලට නිකුත්කිරීමටත් බලාපොරොත්තු වේ .

මීට අමතරව කජු පුහුලන් භාවිතකර Non Alcoholic Beverages ජෑම්, කෝඩියල් වැනි අතුරු නිෂ්පාදන සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම, පුහුණුව ලබාදීම සහ පෞද්ගලික අංශය සමඟ නිෂ්පාදන සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි.

## **4.0** <u>මානව සම්පත් සංවර්ධනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම</u>

### 4.1 **මානව සම්පත පුහුණු කිරීම හා සංවර්ධනය**

කාර්ය මණ්ඩලයේ සියළුම තරාතිරම්වල නිලධාරීන්ගේ පුහුණුව හා සංවර්ධනය සඳහා අවශ්‍ය සෙවාස්ථ පුහුණු සැසි පැවැත්වීමට කටයුතු සිදුකර ඇත. මෙමගින් කාර්ය ඵලදායිතාවය ඉහළ නැංවීමටත් ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබාගැනීමටත් අවස්ථාව සැලසෙන අතර, ස්වයං පෙළඹවීම මගින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් ඉඩප්‍රස්ථා සැලසෙ. මෙම පුහුණු වැඩසටහන් ඉදිරි වර්ෂ 03 තුල අඛණ්ඩව සිදුකිරීමට සැලසුම් කර ඇත.

## 4.2 කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය හා කාර්ය සාධන ඇගයීම

සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල ජාලය සඳහා පරිගණක හා ෆැක්ස් යන්ත්‍ර ලබාදී ඇත. ඒ අනුව අන්තර්ජාල පහසුකම් සහිතව සන්නිවේදන කටයුතු නවීකරණය කර ඇත. වර්තමාන සංවර්ධන ක්‍රියාවලියට අනුරූප වන පරිදි සංස්ථාවේ කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීමටත්, ඒ අනුව බඳවාගැනීමේ හා උසස් වීමේ පටිපාටිය සංශෝධනය කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇත. මෙමගින් කාර්ය මණ්ඩල ව්‍යුහය තුල කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය මූලිකාංග සහිතව සංස්ථාවේ ඉදිරි වසර කිහිපය තුල අභියෝග වලට මුහුණදීම සඳහා මෙම ව්‍යුහාත්මක වෙනස්කම් උපයෝගී කරගනු ඇත. සියළුම තරාතිරම්වල කාර්ය සාධනය ඇගයීම් සිදුකිරීමටද අවශ්‍ය පියවර ගෙන ඇත.

## ශ්‍රී ලංකා කපු සංස්ථාව
## 2014.12.31 දිනට ඒකාබද්ධ ශෙෂ පත්‍රය

| 2013.12.31 රු. | | සටහන | රු. | රු. |
|---|---|---|---|---|
| | **වත්කම්** | | | |
| | **ජංගම නොවන වත්කම්** | | | |
| 63,915,955.56 | දේපළ පිරියත හා උපකරණ | 01 | 77,005,215.45 | |
| 30,465,749.11 | ඵල දරණ වගා නඩත්තු වියදම් | 02 | 35,141,076.20 | |
| 29,288,491.33 | ඵල නොදරණ වගා නඩත්තු වියදම් | 03 | 25,852,827.72 | - |
| 215,375.77 | කෙරිගෙන යන වැඩ - ප්‍රාග්ධන | | 1,046,491.00 | |
| 618,787.46 | අනෙකුත් කුඩා ව්‍යාපෘති | 04 | 614,594.38 | |
| 124,504,359.23 | මුළු ජංගම නොවන වත්කම් | | | 139,660,204.75 |
| | **ජංගම වත්කම්** | | | |
| 29,460,013.42 | තොග | 05 | 48,712,114.42 | |
| 60,042,256.09 | වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ | 06 | 24,842,906.55 | |
| 5,460,727.53 | තැන්පතු අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | 07 | 10,079,743.24 | |
| 66,529,295.29 | මුදල් සහ මුදල් සමාන දෑ | 08 | 60,878,673.12 | |
| 161,492,292.33 | **මුළු ජංගම වත්කම්** | | | 144,513,437.33 |
| **285,996,651.56** | **මුළු වත්කම්** | | | **284,173,642.08** |
| | **ස්කන්ධ සහ වගකීම්** | | | |
| | **ස්කන්ධ** | | | |
| 40,000,000.00 | මූලික ප්‍රාග්ධනය | | 40,000,000.00 | |
| 34,959,185.36 | රාජ්‍ය ප්‍රදාන | | 78,956,936.39 | - |
| 17,910,572.05 | අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන | 09 | 19,303,961.19 | |
| 23,676,376.25 | ප්‍රාග්ධන සංචිත | 10 | 22,215,332.25 | |
| 77,787,906.97 | ලාභ අලාභ ගිණුම | | 56,278,274.35 | |
| 194,334,040.63 | **මුළු ස්කන්ධ** | | | 216,754,504.18 |
| | **ජංගම නොවන වගකීම්** | | | |
| 33,874,951.54 | පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම් | | 42,414,576.01 | |
| 3,256,512.00 | වාහන කල් බදු | | - | |
| 37,131,463.54 | **මුළු ජංගම නොවන වගකීම්** | | 42,414,576.01 | |
| | **ජංගම වගකීම්** | | | |
| 26,848,842.09 | වෙළෙඳ ණයහිමියෝ සහ ගෙවිය යුතු අනෙකුත් දෑ | 11 | 25,004,561.89 | |
| 26,848,842.09 | මුළු ජංගම වගකීම් | | | 67,419,137.90 |
| **258,314,346.26** | **මුළු ස්කන්ධ සහ වගකීම්** | | | **284,173,642.08** |

**එම්.ටී.එස්.කේ.පීරිස්**
**සහකාර සාමාන්‍යාධිකාරී - මුදල්**

**පී.ආර්.ජී.එල්.සී. විජෙවර්ණසූරිය**
**සභාපති**

ශ්‍රී ලංකා කපු සංස්ථාව

පදනම් කරගත් ගිණුම් ප්‍රතිපත්ති -2014

01. පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මත ගිණුම් පිළියෙල කර ඇත.

02. ස්ථාවර වත්කම් සරළ මාර්ග ක්‍රමය මත ක්ෂය කරන ලදි. වර්ෂය තුල මිලට ගත් වත්කම් ගත් දිනය පදනම් කරගෙන ක්ෂය ගණනය කරන ලදි. වර්ෂය තුල නිම කරන ලද ගොඩනැගිළි නිම කරන ලද දිනය පදනම් කරගැනීමෙන් නොව මුළු වර්ෂය සඳහාම ක්ෂය ගණනය කරන ලදි.

03. ක්ෂය කිරීමේ ප්‍රතිශත පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| මෝටර් වාහන | 20% |
| යන්ත්‍ර සූත්‍ර | 10% |
| මෙවලම් සහ උපකරණ | 10% |
| කාර්යාලීය උපකරණ | 10% |
| නළ ලිං / වගා ලිං | 10% |
| ලී බඩු උපකරණ සහ සවිකිරීම් | 06% |
| ස්ථිර ගොඩනැගිලි | 03% |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි | 33% |

04. පහත සඳහන් පදනම මත තොග ගණනය කරන ලදි.

| | | | |
|---|---|---|---|
| කපු මද | : | ශුද්ධ විකුණුම් මිලෙන් | කපු ඇට |
| | : | සහතික කළ වෙනස් වන මිල/වෙළෙඳපොළ මිල | - |

| | | |
|---|---|---|
| ගව සහ බැටළු | : | ඒ ඒ පලාත්වල වෙළෙඳ මිල/ජීව බර අනුව |
| පොල් | : | ශුද්ධ විකුණුම් මිල |
| අනෙකුත් සියළුම තොග | : | පිරිවැයට, ගණනය කරන ලදි. |

05. ප්‍රධාන කාර්යාලීය වියදම් පිරිවැය මධ්‍යස්ථාන අතර එහි අන්තර්ගත මුළු වැටුප් වියදමට අදාලව බෙදා හරින ලදී.

06. වතුයායන්හි සාමාන්‍ය වියදම් මේරූ, නොමේරූ ප්‍රදේශ පැලතවාන් සහ සත්ව පාලනය අතර බෙදීම එම ප්‍රදේශ සඳහා වැයවූ සත්‍ය කම්කරු දින ගණනේ අනුපාතය අනුව බෙදා හරින ලදී.

07. මේරූ ප්‍රදේශ වල ක්‍රමක්ෂය කිරීම වර්ෂයකට 5% බැගින් ගණනය කරන ලදි.

08. බොල් ණය සහ අඩමාන ණය වෙන් කිරීම මුළු ණය ගැතියන්ගෙන් 3.53% බැගින් ගණනය කර ඇත. වෙන් කිරීම් ගිණුමේ වෙනස, වර්ෂය තුල බොල් ණය කපා හැරීම සඳහා මාරු කරන ලදි.

09. පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම පාරිතෝෂිත දීමනා පනතේ සඳහන් පරිදි සෙවය කරන ලද සම්පූර්ණ වර්ෂ ගණනට අනුව ගණනය කරන ලදි. පාරිතෝෂික හිමිකම් ලැබීම සඳහා පනතේ සඳහන් අවම සෙවා කාලය ගිණුම් වර්ෂය තුලදී සම්පූර්ණවූ අයගේ සෙවා පිරිවැය ආදායම් ගිණුමට හර කර ඇත.

10. මෙම සංස්ථාව වෙත රජය මගින් වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන මුදලින් උපලබ්ධි වූ පසු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව දිගුකල් වත්කම් ලෙස හඳුනාගත හැකි ප්‍රාග්ධන වත්කම් හා සංවර්ධන කාර්යයන් අනුසාරයෙන් ඒවා ගිණුම් පොත්වල ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ.

ප්‍රාග්ධන වත්කම් හි ක්ෂයවීම් හා ක්‍රමක්ෂය ලෙස ගිණුම් පොත්වලට ඇතුලත්කර ඇති සත්‍ය වටිනාකම් අදාල ප්‍රාග්ධන වත්කම්වලින් කපා හැරීමෙන් අනතුරුව ඊට සමාන වටිනාකමක් ප්‍රාග්ධන ප්‍රදානවලින් ඉවත් කර ගිණුම්පොත්වල ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

## ශ්‍රී ලංකා කජු සංස්ථාව
## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශෙෂ පත්‍රයට අදාල සටහන්

සටහන් 01

දේපල පිරියත සහ උපකරණ:

| විස්තරය | පිරිවැය/පත්‍යාගණන අගය 2014.01.01 (රු.) | අදාල වසරේ වත්කම් එකතුවීම් / පත්‍යාගණන (රු.) | අදාල වසරේ වත්කම් ඉවත්කිරීම් / විකුණුම් (රු.) | වත්කමේ වර්තමාන පිරිවැය/පත්‍යාගණන වටිනාකම (රු.) | 2014.12.31 දිනට සමුච්චිත ක්ෂය (රු.) | ලියා හරින ලද අගය 2013.12.31 (රු.) |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 9,516,899.57 | 2,259,047.44 | - | 11,775,947.01 | - | 11,775,947.01 |
| ස්ථාවර ගොඩනැගිලි | 39,732,643.38 | 614,385.77 | - | 40,347,029.15 | 14,722,416.51 | 25,624,612.64 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි | - | 162,210.00 | - | 162,210.00 | 12,614.17 | 149,595.83 |
| වාහන | 50,066,717.84 | 20,900,398.00 | 515,000.00 | 70,452,115.84 | 43,541,082.04 | 26,911,033.80 |
| යන්ත්‍ර සූත්‍ර | 14,039,320.45 | 249,547.20 | - | 14,288,867.65 | 9,201,934.90 | 5,086,932.75 |
| මෙවලම් හා උපකරණ | 8,489,447.43 | 79,440.50 | - | 8,568,887.93 | 7,589,547.57 | 979,340.36 |
| කාර්යාලීය උපකරණ | 9,768,002.49 | 204,170.00 | - | 9,972,172.49 | 7,604,387.84 | 2,367,784.65 |
| ලී බඩු හා සවිකිරීම් | 6,087,886.82 | 307,298.50 | - | 6,395,185.32 | 3,813,092.85 | 2,582,092.47 |
| නළ ළිං | 826,682.00 | - | - | 826,682.00 | 426,451.55 | 400,230.45 |
| වගා ළිං | 499,499.00 | 145,500.00 | - | 644,999.00 | 126,178.13 | 518,820.87 |
| වැව් | 608,824.62 | - | - | 608,824.62 | - | 608,824.62 |
| | **139,635,923.60** | **24,921,997.41** | **515,000.00** | **164,042,921.01** | **87,037,705.56** | **77,005,215.45** |

## ශ්‍රී ලංකා කජු සංස්ථාව
## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශෙෂ පත්‍රයට අදාල සටහන්

### සටහන 02

| | | |
|---|---|---|
| ඵල දරණ වගාව - කජු | (සටහන 2 අ) | 32,636,075.85 |
| පොල් - | (සටහන 2 ආ) | 2,505,000.35 |
| | | **35,141,076.20** |

### සටහන 02 (අ)
ඵල දරණ වගාව - කජු

| වතුයාය | පිරිවැය 2014.01.01 (රු.) | 2014.12.31 දිනට සමුච්චිත ක්ෂය | ලියා හරින ලද අගය 2014.12.31 (රු.) |
|---|---|---|---|
| හාඩි වතුයාය | 2,928,520.81 | 1,615,294.83 | 1,313,225.98 |
| කමන්දළුව වතුයාය | 14,708,944.94 | 9,795,627.37 | 4,913,317.57 |
| පුත්තලම වතුයාය | 30,069,888.71 | 16,745,746.01 | 13,324,142.70 |
| එළුවන්කුලම බීජ උද්‍යානය | 13,933,185.28 | 8,175,578.56 | 5,757,606.72 |
| විලච්චිය ශාක අභිජනන මධ්‍යස්ථානය | 655,569.86 | 97,627.31 | 557,942.55 |
| ඇල්කඩුව ශාක අභිජනන මධ්‍යස්ථානය | 4,440,584.27 | 603,837.40 | 3,836,746.87 |
| මහඔය ශාක අභිජනන මධ්‍යස්ථානය | 1,150,848.05 | 57,542.40 | 1,093,305.65 |
| මොණරාගල ශාක අභිජනන මධ්‍යස්ථානය | 1,936,618.75 | 96,830.94 | 1,839,787.81 |
| | **69,824,160.67** | **37,188,084.82** | **32,636,075.85** |

### සටහන් 02 (ආ)
**ඵල දරණ වගාව - පොල්**

| වතුයාය | පිරිවැය 2014.01.01 (රු.) | 2014.12.31 දිනට සමුච්චිත ක්ෂය | ලියා හරින ලද අගය 2014.12.31 (රු.) |
|---|---|---|---|
| **හාඩි වතුයාය** | 1,439,080.66 | 410,946.78 | 1,028,133.88 |
| **කමන්දළුව වතුයාය** | 2,437,612.22 | 1,079,543.82 | 1,358,068.40 |
| **පුත්තලම වතුයාය** | 431,998.76 | 313,200.69 | 118,798.07 |
| | **4,308,691.64** | **1,803,691.29** | **2,505,000.35** |

## ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශෙෂ පත්‍රයට අදාල සටහන්

### සටහන් 03

| | | | |
|---|---|---|---|
| එල නොදරණ වගාව | - කජු | (සටහන 3 අ) | 21,603,728.88 |
| | - පොල් | (සටහන 3 ආ) | 4,249,098.84 |
| | | | **25,852,827.72** |

**(සටහන 3 අ)**

**එල නොදරණ වගාව-කජු**

| වතුයාය | 2014.12.31 දිනට පිරිවැය |
|---|---|
| හාඩි වතුයාය | 2,118,383.71 |
| කමන්දළුව වතුයාය | 3,151,152.05 |
| පුත්තලම වතුයාය | 2,858,742.38 |
| එළුවන්කුලම බීජ උද්‍යානය | 468,616.64 |
| මාන්ක(ර්)නි වතුයාය | 1,244,084.70 |
| ඇල්කඩුව ශාක අභිජනන මධ්‍යස්ථානය | 1,380,669.30 |
| මහඔය බීජ උද්‍යානය | 443,285.25 |
| මොණරාගල බීජ උද්‍යානය | 220,336.00 |
| පර්යේෂණ හා සංවර්ධන | 1,366,018.75 |
| නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය | 135,360.40 |
| ඔයාමඩුව ශාඛ අභිජනන මධ්‍යස්ථානය | 7,459,045.38 |
| විලච්චිය ශාක අභිජනන මධ්‍යස්ථානය | 4,288.00 |
| කොණ්ඩච්චි ශාක අභිජනන මධ්‍යස්ථානය | 753,746.32 |
| | **21,603,728.88** |

### සටහන් 03 (ආ)

**එල නොදරණ වගාව - පොල්**

| වතුයාය | 2014.12.31 දිනට පිරිවැය |
|---|---|
| හාඩි වතුයාය | 1,857,437.72 |
| කමන්දළුව වතුයාය | 754,890.24 |
| පුත්තලම වතුයාය | 630,182.49 |
| ඔයාමඩුව ශාඛ අභිජනන මධ්‍යස්ථානය | 1,006,588.39 |
| | **4,249,098.84** |

## ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශෙෂ පත්‍රයට අදාල සටහන්

**සටහන් 04**
**අනෙකුත් කුඩා ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය | 2014.12.31 දිනට පිරිවැය |
|---|---|
| තේක්ක පැල ව්‍යාපෘතිය | 366,606.53 |
| පැපොල් ව්‍යාපෘතිය | 237,187.85 |
| කෙසෙල් හා දෙහි ව්‍යාෘතිය | 10,800.00 |
| | **614,594.38** |

**සටහන් 05**
**ජංගම**
**වත්කම්**

**තොග**

| | |
|---|---|
| විවිධ | 4,050,553.19 |
| වයින් | 693,206.64 |
| සත්ව පාලනය | 3,562,360.00 |
| කජු මද | 10,488,706.85 |
| කජු ඇට | 24,142,430.74 |
| පැල | 5,206,342.10 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 554,690.90 |
| පොල් | 13,824.00 |
| | **48,712,114.42** |

**සටහන් 06**
**වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ**

| | | |
|---|---|---|
| වෙළඳ ණයගැතියෝ | 458,108.50 | |
| අඩු කළා - බොල්ණය වෙන් කිරීම | 16,171.00 | 441,937.50 |
| විවිධ ණයගැතියෝ | 25,408,763.05 | |
| හානි වීම් වලින් වන අලාභ | 1,007,794.00 | 24,400,969.05 |
| | | **24,842,906.55** |

## ශ්‍රී ලංකා කපු සංස්ථාව

## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශෙෂ පත්‍රයට අදාල සටහන්

### සටහන් 07
### තැන්පතු, අත්තිකාරම් සහ පෙර ගෙවුම්

| | |
|---|---|
| අත්තිකාරම් | 449,790.00 |
| පෙර ගෙවුම් | 6,144,405.74 |
| තැන්පතු | 3,485,547.50 |
| | **10,079,743.24** |

### සටහන් 08
### මුදල් හා මුදල් සමාන දෑ

| | |
|---|---|
| මුදල් - මාර්ගස්ථ | 83,708.94 |
| මුදල් - අත ඉතිරි හා බැංකු ඉතිරි | 60,794,964.18 |
| | **60,878,673.12** |

### සටහන් 09
### අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුනු ප්‍රදාන

| | |
|---|---|
| උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය | 7,021,916.21 |
| අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශය | 1,612,451.80 |
| සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | 10,669,593.18 |
| | **19,303,961.19** |

### සටහන් 10
### ප්‍රාග්ධන සංචිත

| | |
|---|---|
| ප්‍රත්‍යාගණන සංචිතය - වාහන | 21,702,602.03 |
| අනෙකුත් ප්‍රාග්ධන සංචිත | 512,730.22 |
| | **22,215,332.25** |

ශ්‍රී ලංකා කජු සංස්ථාව

2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශෙෂ පත්‍රයට අදාල සටහන්

**සටහන් 11**
**ජංගම වගකීම්**

| | |
|---|---|
| විවිධ ණයහිමියෝ | 13,911,424.81 |
| උපචිත වියදම් | 11,093,137.08 |
| | **25,004,561.89** |

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව හඳුනාගත් පෙර වර්ෂයට අදාල ගැලපීම් හා ගිණුම්කරණ ඇස්තමේන්තුවල අවශ්‍ය වෙනස්කම් සිදු කර ඒ අනුව, 2014 වර්ෂයට අදාල සැසඳීම් වටිනාකම් මූල්‍ය ප්‍රකාශවලට ඇතුලත් කර ඇත.

## ශ්‍රී ලංකා කජු සංස්ථාව
## වාණිජ අංශය
## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ලාභ අලාභ ගිණුම

| **2013.12.31** (රු.) | | | 2014.12.31 (රු.) |
|---|---|---|---|
| | **විකුණුම් / පිරිවැටුම** | | |
| 79,451,283.62 | | කජු මද | 63,334,146.00 |
| - | | බීජ කජු ඇට | - |
| 54,306,175.00 | | කජු පැල | 50,865,900.00 |
| 447,484.03 | | පොල් | 1,170,028.84 |
| (24,570.00) | | ආපසු එවුම් | - |
| **134,180,372.65** | | ශුද්ධ විකුණුම් | **115,370,074.84** |
| | අඩුකලා: | **විකුණුම් පිරිවැය** | |
| (2,379,414.63) | | තොග අඩු/ වැඩිවීම් | (292,510.82) |
| 8,286,338.92 | | තවාන් වියදම් | 6,831,406.95 |
| 53,777,950.91 | | කජු මද නිෂ්පාදන පිරිවැය / පොදුකාර්ය | 27,257,248.33 |
| 16,005,236.36 | | එල දරණ වගා නඩත්තු වියදම් | 19,939,368.87 |
| 6,895,925.38 | | එල දරණ වගා සෘජු වියදම් | 8,640,179.67 |
| 82,586,036.94 | මුළු විකුණුම් පිරිවැය | | 62,375,693.00 |
| **51,594,335.71** | දළ ලාභය: | | **52,994,381.84** |
| | අඩුකලා : | **අනෙකුත් වියදම්** | |
| 22,076,033.71 | | පරිපාලන වියදම් (පිරිසැකසුම් සහ තවාන්) | 29,345,618.67 |
| 22,076,033.71 | | | 29,345,618.67 |
| **29,518,302.00** | **ලාභ (අලාභ) ක්‍රමක්ෂය කිරීමට පෙර** | | **23,648,763.17** |
| 3,044,757.11 | | ක්‍රමක්ෂය | 3,283,050.99 |
| **26,473,544.89** | **ලාභ (අලාභ) ක්‍රමක්ෂය කිරීමට පසු** | | **20,365,712.18** |
| (54,807.78) | | ලාභ / (අලාභ) වයින් | 313,034.62 |
| 95,000.00 | | ලාභ / (අලාභ) පිරිසැකසුම් උපකරණ | 129,400.00 |
| - | | | 8,586.81 |
| 247,215.52 | | ලාභ / (අලාභ) සත්ව පාලනය | (307,992.97) |
| **26,760,952.63** | **ක්‍රියාන්විතයෙන් ලත් ශුද්ධ ලාභ / (අලාභ)** | | **20,508,740.64** |
| - | | අනෙකුත් ආදායම් | - |
| 22,774,500.00 | | රාජ්‍ය ප්‍රදාන පුනරාවර්තන | 21,235,000.00 |
| 2,531,823.00 | | ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ ලාභය | 265,147.00 |
| 6,668,907.90 | | පොලී ආදායම් | 3,151,683.11 |
| 846,271.90 | | වෙනත් ආදායම් | 498,181.30 |
| 160,030.74 | | ක්‍රමක්ෂය - වෙනත් පාර්ශවයන්ගෙන් ලත් ප්‍රදාන | 161,036.82 |
| **32,981,533.54** | | මුළු අනෙකුත් ආදායම් | **25,311,048.23** |
| 21,417,288.22 | | පරිපාලන වියදම් (ප්‍රධාන කාර්යාලය) | 24,050,413.02 |
| **28,118,164.41** | ශුද්ධ ලාභය | | **21,769,375.85** |

### ශ්‍රී ලංකා කජු සංස්ථාව

### සේවා අංශය

### 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම

| 2013.12.31 (රු.) | | | (රු.) |
|---|---|---|---|
| | **ආදායම** | | |
| 23,032,116.15 | රාජ්‍ය ප්‍රදාන ප්‍රාග්ධන ප්‍රවර්තන වසර | | 17,072,009.24 |
| 1,852,413.21 | ක්‍රමක්ෂය | | 2,215,710.37 |
| 29,725,500.00 | පුනරාවර්තන | | 28,765,000.00 |
| **54,610,029.36** | **මුළු ආදායම** | | **48,052,719.61** |
| | අඩු කළා : | | |
| | **වියදම්** | | |
| 27,954,053.91 | ප්‍රධාන කාර්යාලය | 32,578,767.62 | |
| 23,032,116.15 | ප්‍රාග්ධන දීමනා යටතේ | 17,072,009.24 | |
| 38,027,315.36 | ව්‍යාප්ති සේවා | 42,451,595.13 | |
| 2,192,343.89 | පර්යේෂණ හා සංවර්ධන | 2,839,104.31 | |
| 762,504.52 | ඔයාමඩුව ශාක අභිජනන මධ්‍යස්ථානය | 731,327.44 | |
| - | ඔයාමඩුව ශාක අභිජනන මධ්‍යස්ථානය | 206,933.20 | |
| 91,968,333.83 | මුළු වියදම | | 95,879,736.94 |
| **(37,358,304.47)** | **වර්ෂය තුල ආදායම ඉක්මවූ වියදම අවසාන ඒකාබද්ධ ලාභ අලාභ ගිණුමට මාරු කලා** | | **(47,827,017.33)** |

## ශ්‍රී ලංකා කපු සංස්ථාව

## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ඒකාබද්ධ ලාභ අලාභ ගිණුම

| 2013.12.31 | | | |
|---|---|---|---|
| 38,325,197.95 | වාණිජ අංශයෙන් ඉපයූ ශුද්ධ ලාභය | | 21,769,375.85 |
| (37,358,304.47) | වර්ෂය සඳහා ආදායම ඉක්ම වූ වියදම - සේවා අංශය | | (47,827,017.33) |
| **966,893.48** | | | **(26,057,641.48)** |
| - | පෙර වර්ෂයට අදාල ගැලපීම් | 996,618.81 | |
| 80,372,403.54 | ලාභ/අලාභ පහලට ගෙන ගියා | 81,339,297.02 | |
| 80,372,403.54 | | | 82,335,915.83 |
| **81,339,297.02** | ලාභ/අලාභ ඉදිරියට ගෙන ගියා | | **56,278,274.35** |

ශ්‍රී ලංකා කජු සංස්ථාව

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය | |
|---|---|---|
| | (රු.) | (රු.) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| **වර්ෂය තුල ඉපයූ ශුද්ධ ලාභය** | | **(26,057,641.48)** |
| මුදල් චලනයන් නොවූ අයිතමයන් සඳහා ගැලපීම් | | |
| කෂය වීම් | 11,915,716.80 | |
| ක්‍රමක්ෂය | 3,437,424.33 | |
| පාරිතෝෂිත දීමනා සඳහා වෙන් කිරීම | 9,743,212.47 | |
| බොල්ණය සඳහා ලියා හැරීම හෝ වෙන් කිරීම | 1,023,965.00 | |
| ස්ථාවර වත්කම් හුවමාරුවෙන් වූ අලාභය | (265,147.00) | |
| වතු වල අගය ලියා හැරීම | (8,112,751.42) | |
| අනෙකුත් කුඩා ව්‍යාපෘති ලියා හැරිම | 160,474.53 | |
| අනෙකුත් පාර්ශව ප්‍රධාන ක්‍රමක්ෂය | (161,036.82) | |
| ප්‍රාග්ධන දීමනා ක්‍රමක්ෂය | (19,287,719.61) | |
| | | (1,545,861.72) |
| කාරක ප්‍රාග්ධනයේ වෙනසට පෙර මෙහෙයුම් ලාභය / පාඩුව | | (27,603,503.20) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| තොගය - (වැඩිවීම) / අඩුවීම | (19,252,101.00) | |
| ණය ගැතියෝ - (වැඩිවීම) / අඩුවීම | 34,924,145.54 | |
| අත්තිකාරම් සහ පෙර ගෙවීම් - (වැඩිවීම) / අඩුවීම | (4,619,015.71) | |
| ණය හිමියෝ - වැඩිවීම / (අඩුවීම) | 639,900.33 | |
| උපචිත වියදම් - වැඩිවීම / (අඩුවීම) | (2,484,180.53) | |
| අනෙකුත් ගෙවිය යුතු දෑ - වැඩිවීම / (අඩුවීම) | (3,256,512.00) | |
| | | 5,952,236.63 |
| | | (21,651,266.57) |
| පාරිතෝෂිත ගෙවීම් | | (1,203,588.00) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(22,854,854.57)** |

**<u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය</u>**

| | (රු.) | (රු.) |
|---|---|---|
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (24,921,997.41) | |
| ස්ථාවර වත්කම් විකිණීම | 243,500.00 | |
| කෙරිගෙන යන වැඩ - ප්‍රාග්ධන | (831,115.23) | |
| හිමිකම් ප්‍රධාන නිදහස් කිරිම | (226,011.65) | |
| නව වගා සඳහා ආයෝජනය කිරිම | 3,435,663.61 | |
| වෙනත් කුඩා ව්‍යාපෘති සඳහා ආයෝජනය | 4,193.08 | |
| | | (22,295,767.60) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | (45,150,622.17) |
| **<u>මූල්‍ය ක්‍රියාකාරම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය</u>** | | |
| රාජ්‍ය ප්‍රදාන | | 39,500,000.00 |
| වර්ෂය තුලදී මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / අඩුවීම | | (5,650,622.17) |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | **66,529,295.29** |
| | | **60,878,673.12** |

| (සටහන් 01) | **2014.01.01** දිනට | **2014.12.31** දිනට |
|---|---|---|
| අත ඉතිරි සහ බැංකු ඉතිරි මුදල් | 66,445,274.39 | 60,794,964.18 |
| මාර්ගස්ථ මුදල් | 84,020.90 | 83,708.94 |
| | **66,529,295.29** | **60,878,673.12** |

## ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

| වෙනස්වීම් | මූලික ප්‍රාග්ධනය | රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රාග්ධන ප්‍රදාන - උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රජා.සං.වැඩසටහන | ප්‍රාග්ධන ප්‍රදාන - අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශය | ප්‍රත්‍යාගණන සංචිතය | අනෙකුත් ප්‍රාග්ධන සංචිත | ප්‍රදාන සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | ලාභ ලාභ ගිණුම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2014.01.01 දිනට ශේෂය | 40,000,000.00 | 58,744,656.00 | 7,247,927.86 | 1,612,451.80 | 21,728,653.03 | 512,730.22 | 10,830,630.00 | 81,339,297.02 | 222,016,345.93 |
| වර්ෂ තුළදී ලද ප්‍රදාන | - | 39,500,000.00 | - | - | - | - | - | - | 39,500,000.00 |
| ලාභ අලාභ ගිණුමට මාරු කිරීම | - | (19,287,719.61) | (226,011.65) | - | - | - | (161,036.82) | - | (19,674,768.08) |
| වත්කම් ඉවත් කිරීමේ ගිණුමට මාරු කිරීම | - | - | - | - | (26,051.00) | - | - | - | (26,051.00) |
| පෙර වර්ෂයේ ගැලපීම | - | - | - | - | - | - | - | 996,618.81 | 996,618.81 |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය / අලාභය | - | - | - | - | - | - | - | (26,057,641.48) | (26,057,641.48) |
| **2014.12.31 දිනට ශේෂය** | **40,000,000.00** | **78,956,936.39** | **7,021,916.21** | **1,612,451.80** | **21,676,551.03** | **512,730.22** | **10,669,593.18** | **56,278,274.35** | **216,754,504.18** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. LP/A/SLC/01/14/09

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2015 ජුලි 24 දින

ශ්‍රී ලංකා කජු සංස්ථාව
සභාපති කාර්යාලය
03 AUG 2015

සභාපති
ශ්‍රී ලංකා කජු සංස්ථාව

**ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සි) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2015 ජුනි 22 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී.ලං.ගි.ප්‍ර.01 — මූල්‍ය ප්‍රකාශන අවබෝධ කරගැනීම සඳහා වැදගත් වන ගිණුම් පිළියෙල කිරීමේ දී භාවිතා කළ ගිණුම්කරණ පදනම හෝ පදනම් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී.ලං.ගි.ප්‍ර.02 — කජු ආශ්‍රිත නිෂ්පාදනයන් 47 කට අදාළ පිරිවැය වෙනවෙනම ගණනයකර තොග අගය කිරීම වෙනුවට සියළුම නිෂ්පාදනවල සාමාන්‍ය පිරිවැය අනුව තොග අගය කර තිබුණු බැවින් සමහර නිෂ්පාදනයන්හි විකුණුම් මිළ සාමාන්‍ය පිරිවැයට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර.08 — ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රමාණාත්මක පෙර කාලපරිච්ඡේද වැරදි ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් නිවැරදි කළ යුතු වුවත් පැළතවාන් අංශයේ 2013 වර්ෂයට අදාළ රු.996,619 ක පැළ තවාන් වියදම් වැඩියෙන් දැක්වීම අතීතානුයෝගී ගැලපීම් ලෙස ගලපා තිබුණි.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර.16

(i) ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රත්‍යාගණිත අගයට ප්‍රකාශ කර ඇති වාහන සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනය සහ ස්වාධීන තක්සේරුකරුවකු යොදා ගත්තේද යන බව හෙළිදරව් කර නොතිබුණි.

(ii) දේපල, පිරියත සහ උපකරණවලට අදාලව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට සමුච්චිත ක්ෂය සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය සහ අපහරණය කරන ලද වත්කම්වල ක්ෂයවීම හෙළිදරව් කර නොතිබුණි.

(iii) ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට තවත් ප්‍රත්‍යාගණනයක් අවශ්‍ය වන නමුත් 2009 වර්ෂයෙන් පසුව වාහන සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනයක් සිදු කර නොතිබුණු අතර සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු රු.25,600,800 ක් වූ වාහන සංස්ථාව විසින් තවදුරටත් ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(iv) ප්‍රමිතිය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණවල සාධාරණ අගය විශ්වාසදායි ලෙස මැනිය හැකි විට එහි ප්‍රත්‍යාගණිත අගයට දක්වන බව ගිණුම්කරණ ප්‍රතිපත්තින් මගින් හෙළිදරව් කර තිබුණද වාහන හැර සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු.20,231,977 ක් වූ දේපල පිරියත හා උපකරණ සංස්ථාව විසින් තවදුරටත් ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(ඉ) ශ්‍රී.ලං.ගි.ප්‍ර.19 සුදුසුකම්ලත් ආයුගණක තක්සේරුකරුවකු මගින් හෝ පාරිතෝෂික සූත්‍ර ක්‍රමය මගින් සියළුම ප්‍රමාණාත්මක පශ්චාත් සේවා ප්‍රතිලාභ බැඳීම් මැනීමට අවශ්‍ය වන නමුත් පාරිතෝෂික සඳහා වෙන් කිරීම් ඒ අනුව තක්සේරු කරමින් ප්‍රවර්තන සේවා පිරිවැය, පොළී පිරිවැය, ආයුගණක ලාභ සහ අලාභ ගණනය කර නොතිබුණි.

(ඊ) ශ්‍රී.ලං.ගි.ප්‍ර.39 වෙළඳ ණයගැතියන් සහ අනෙකුත් ලැබිය යුතු දෑ, තැන්පතු, අත්තිකාරම් සහ කලින් ගෙවීම්, මුදල් හා මුදල්වලට සමාන වත්කම් සහ වෙළඳ ණයහිමියන් හා අනෙකුත් ගෙවිය යුතු දෑ මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් ලෙස හඳුනාගැනීම, මිණුම්කරණය, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම ප්‍රමිත ප්‍රකාරව සිදුකර ඇද්ද යන්න හෙළිදරව් කර නොතිබුණි.

(උ) ශ්‍රී.ලං.ගි.ප්‍ර.41 සංස්ථාව සතු ජෛව විද්‍යාත්මක වත්කම් එනම් කජු ගස් මෙම ප්‍රමිතිය ප්‍රකාරව සාධාරණ අගයට ගිණුම්ගත කිරීම සහ හෙළිදරව් කිරීම කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වරලත් අලෙවි සැල් සඳහා කජු අලෙවි කිරීමේදී උපචිත පදනම මත විකුණුම් හඳුනාගැනීම වෙනුවට මුදල් පදනම මත විකුණුම් හඳුනාගෙන තිබූ අතර ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.460,982 ක ලැබිය යුතු ශේෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට රාජ්‍ය ප්‍රදාන ගිණුමේ ශේෂය රු.78,956,936 ක් වන අතර එම ශේෂය රාජ්‍ය ප්‍රදානවලින් අත්පත් කරගත් ස්ථාවර වත්කම්, මේරූ ප්‍රදේශ වියදම් සහ නොමේරූ ප්‍රදේශ වියදම්වල සමාලෝචිත වර්ෂය අවසානයේ ශුද්ධ අගයට සමාන විය යුතු නමුත් රු.37,915,049 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව පාරිතෝෂික වෙන් කිරීම සහ පාරිතෝෂික ගෙවීම් පිළිවෙලින් රු.10,009,513 ක් සහ රු.1,469,889 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය පිළිවෙලින් රු.9,743,212 ක් සහ රු.1,203,588 ක් ලෙස දක්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් වටිනාකම් තහවුරු කර ගැනීම සඳහා සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

| විෂය | වටිනාකම<br>රු. | සාක්ෂි නොවීම |
|---|---|---|
| හානි වූ කජු පැළ | 3,759,120 | 90,658 ක් වූ හානි වූ කජු පැළ පිළිබඳ සත්‍යාපන වාර්තා |
| කජු පැළ අලෙවිය | 894,100 | කජු පැළ 8,761 ක් නිකුත් කිරීමට අදාළ නිකුත් කිරීමේ නිවේදන |

### 2.2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් වටිනාකම රු.මිලියන 8.5 ට නොවැඩි මෝටර් කාර් රථයක් හෝ කැබ් රථයක් සභාපතිවරයා සඳහා මිළදී ගැනීම අනුමත කර තිබුණද එම සීමාව නොසලකා රු. 9,860,000 ක් වටිනා ජීප් රථයක් සංස්ථාව විසින් 2014 ජනවාරි මාසයේදී මිළදී ගෙන තිබුණි. තවද මෙම වාහනය රාජ්‍ය නිලධාරියකුට නිකුත් කර තිබුණු තීරුබදු සහන වාහන බලපත්‍රයක් යටතේ ගෙන්වා පළමු අයිතිකරු ලෙස ඔහුගේ නමින් ලියාපදිංචි කර වාහනයේ දෙවන අයිතිකරු වශයෙන් සංස්ථාවේ නමට ලියාපදිංචිය මාරු කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එමින් පැවති ණයගැති ශේෂය රු.2, 003,354 ක් වූ අතර එයින් රු. 1,962,800 ක් 2009 වර්ෂයේදී ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයට පැළ ලබාදීම වෙනුවෙන් ලැබිය යුතු ණය ශේෂයක් විය.

(ආ) වසර කිහිපයක සිට පැවත එන රු.775,134 ක් වූ රඳවා ගැනීමේ බදු ගැලපීමෙන් තොරව ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

| | |
|---|---|
| (ඇ) 2011 සැප්තැම්බර් 15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 58 (2) | සභාපතිවරයාට සහ උපසභාපතිවරයාට ජීවන වියදම් දීමනා ගෙවිය නොහැකි වුවත් ඊට පටහැනිව 2014 ජනවාරි සිට සැප්තැම්බර් 19 දින දක්වා ජීවන වියදම් දීමනා ලෙස රු.135,980 ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් කටයුතු වලින් රු.26,057,641 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.966,893 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.27,024,534 ක අඩුවීමක් නිරීක්ෂණය විය. වාණිජ අංශයේ වියදම රු.11,944,770 කින් අඩුවීම හා ආදායම රු.18,679,725 කින් පහත වැටීමත්, සේවා අංශයේ ආදායම රු.13,745,051 කින් අඩුවීම හා වියදම් රු.6,544,528 කින් වැඩිවීමත් මීට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ පැවති තත්ත්වය සමඟ සසඳා පහත දැක්වේ.

(අ) වාණිජ අංශය

| වතු සහ අලෙවි අංශය | 2014 රු. | 2013 රු. | වෙනස්වීමේ ප්‍රතිශතය වැඩිවීම/ (අඩුවීම) | වාණිජ පැළතවාන් අංශය 2014 රු. | 2013 රු. | වෙනස්වීමේ ප්‍රතිශතය වැඩිවීම/ (අඩුවීම) |
|---|---|---|---|---|---|---|
| මුළු ආදායම | 70,173,571 | 85,411,920 | (18) | 50,865,900 | 54,307,276 | (6) |
| මුළු වියදම් | 76,185,806 | 91,462,288 | (17) | 24,059,934 | 20,728,222 | 16 |
| මෙහෙයුම් ලාභය/ අලාභය | (6,012,235) | (6,050,368) | (1) | 26,805,966 | 33,579,054 | (20) |
| ලාභාන්තිකය සියයට | (8) | (7) | | 111 | 162 | |

(ආ) සේවා අංශය

| | 2014 රු. | 2013 රු. | වෙනස්වීමේ ප්‍රතිශතය වැඩිවීම (අඩුවීම ) |
|---|---|---|---|
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | 19,448,757 | 25,044,560 | (22) |
| පුනරාවර්තන | 50,000,000 | 52,500,000 | (5) |
| වාණිජ අංශයේ ලාභ | 20,793,731 | 27,528,686 | (24) |
| පොලී ආදායම | 3,151,683 | 6,668,908 | (53) |
| වත්කම් ඉවත්කිරීමේ ලාභය | 265,147 | 2,531,823 | (90) |
| වෙනත් ආදායම් | 213,191 | 78,538 | 171 |
| මුළු ආදායම | 93,872,509 | 114,352,515 | (18) |
| සේවා අංශයේ මුළු වියදම | 119,930,150 | 113,385,622 | 6 |
| ලාභය/අලාභය | 26,057,641 | 966,893 | |

(i) වතු සහ අලෙවි අංශයේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අලාභය නිෂ්පාදන පිරිවැයෙන් සියයට 8 ක් වූ අතර පසුගිය වර්ෂයේ මෙහෙයුම් අලාභය සියයට 7 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂයේදී බීජ කජු පැළයක සහ බද්ධ කජු පැළයක පිරිවැය පිළිවලින් රු.31 ක් සහ රු.43 ක් වූ අතර විකුණුම් මිළ පිළිවලින් රු.100 ක් හා රු.200 ක් වූයෙන් වාණිජ පැළතවාන් අංශයේ සියයට 111 ක ඉහළ ලාභාන්තිකයක් ළගාකරගෙන තිබුණි.

(iii) දිවිනැගුම වැඩසටහනට කජු පැළ නිකුත් කිරීම හේතුවෙන් 2011 වර්ෂයේ සිට කජු පැළ අලෙවි ආදායම් සීඝ්‍ර ලෙස වැඩි වී තිබුණු නමුත් 2012 වර්ෂයට සාපේක්ෂව 2013 සහ 2014 වර්ෂ වලදී කජු පැළ ආදායම පිළිවලින් සියයට 47 කින් සහ සියයට 50 කින් අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව සතු කජු වතුවල නිෂ්පාදනය, නිෂ්පාදන පිරිවැය හා වගා ප්‍රමාණ පිළිබද තොරතුරු පහත දැක්වේ.

| වතුයාය | නිෂ්පාදනය ලෙලි කජු | නිෂ්පාදන පිරිවැය | කි.ග්‍රෑ.1ක පිරිවැය | මේරුකජු ප්‍රදේශ හෙක්ටයාර් | නොමේරු කජු ප්‍රදේශ හෙක්ටයාර් | වයස් මට්ටම මේරු | නොමේරු |
|---|---|---|---|---|---|---|---|
| | (කි.ග්‍රෑ) | | රු. | | | අවු. | අවු. |
| පුත්තලම | 7,261.0 | 10,177,233 | 1402 | 204.50 | 98.89 | 30 ට වැඩි | 5 ට අඩු |
| කමන්දළුව | 15,223.0 | 9,368,145 | 615 | 119.00 | 47.00 | 30 ට වැඩි | 5 ට අඩු |
| එළුවන්කුලම | 64,591.5 | 8,030,063 | 124 | 72.50 | 10.50 | 14 ට වැඩි | 5 ට අඩු |
| හාඩි | 5,834.0 | 1,677,705 | 288 | 70.85 | 20.24 | 30 ට වැඩි | 5 ට අඩු |
| නාලන්දා | 6,813.5 | 1,470,848 | 216 | 20.24 | 8.09 | 10 ට වැඩි | 5 ට අඩු |
| විලච්චිය | 1,076.5 | 235,139 | 218 | 7.28 | 2.83 | 10 ට වැඩි | 5 ට අඩු |
| මහඔය | 537.0 | - | | | 10.12 | | 5 ට අඩු |
| සුදුවතුර ආර | 100.0 | - | | | 10.12 | | 5 ට අඩු |
| එකතුව | 101,436.5 | | | 494.37 | 207.79 | | |

(i) ඉහත වගුව අනුව 2010 වර්ෂයේ බෙදා දෙන ලද බීජ හා බද්ධ කපු පැළ 193,800 කින් 2014 වර්ෂය අවසානයට සාර්ථක වූ වගාව පැළ 34,061 ක් හෙවත් සියයට 17.5 ක් විය.

(ii) එසේම 2011 වර්ෂයේ ලබාදුන් බීජ හා බද්ධ කපු පැළ 195,660 කින් 2014 වර්ෂය අවසානයට සාර්ථක වූ පැළ ප්‍රමාණය 42,610 ක් හෙවත් සියයට 21.8 ක් විය.

(iii) 2010 වර්ෂයේදී සංස්ථාව විසින් සහනාධාර වැඩසටහන සඳහා රු.22,403,139 ක් හා 2011 වර්ෂයේදී රු.21,098,216 ක් වැය කර තිබුණි. වාර්ෂිකව සහනාධාර ලෙස ප්‍රාග්ධන ප්‍රදාන විශාල ප්‍රමාණයක් ආයෝජනය කර තිබුණත් වැඩසටහනෙහි ප්‍රගතිය පහළ මට්ටමක පැවතුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වාණිජ පැළ තවාන්වල බද්ධ පැළ සහ බීජ පැළ මියයාම නිසා සිදුව තිබුණු අලාභය රු.3,759,120 ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 3,851 ක් වැනි ඉතා ඉහළ අගයකින් වැඩි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පුත්තලම, කමන්දළුව හා හාඩි වතුයායන්හි ආදායමට සාපේක්ෂව ඒවායේ සෘජු හා පරිපාලන වියදම් වැඩිවීම හේතුවෙන් එම වතු පිළිවෙලින් රු. 8,095,121 ක , රු. 4,535,952 ක හා රු. 268,105 ක මෙහෙයුම් අලාභයන් ලබා තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2013 ජුනි 04 දින සිට නව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ යටතේ සේවකයා සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් සඳහා බාහිර ප්‍රතිකාර සඳහා වාර්ෂිකව රු.15,000 ක් සහ රෝහල්ගත ප්‍රතිකාර සඳහා වාර්ෂිකව රු.50,000 ක් දක්වා වියදම් ප්‍රතිපූර්ණය කරන අතර මාසික සාමාජික ගාස්තුව රු.300 ක් විය. ඉහත වියදම් ප්‍රතිපූරණ සීමා සභාපතිවරයා සඳහා අදාළ නොවන බවට වගන්තියක් වෛද්‍යාධාර යෝජනා ක්‍රමයේ සඳහන් කර තිබුණු අතර සභාපතිවරයාගේ වෛද්‍ය වියදම් ලෙස 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් රු.286,655 ක් හා රු. 104,772 ක් ගෙවා තිබුණි.

(i) සංස්ථාව සතු කජු වගා ඉඩම් හෙක්ටයාර් 494 කින් හෙක්ටයාර් 394 ක කජු වගාවන් අවුරුදු 30 ට වැඩි ආයුකාලයක් පසුකර තිබුණි. එසේ වුවද සංස්ථාව 2013 වර්ෂයේදී පැරණි වගාවෙන් යුතු ඉඩම් හෙක්ටයාර් 40 ක් නැවත වගා කර තිබුණත්, 2014 වර්ෂයේදී පැරණි වගාවෙන් යුතු ඉඩම්වල නැවත වගා කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ලෙලි කජු කි.ග්‍රෑ.එකක වෙළඳපොළ මිළ රු.250 ක් පමණ වූ අතර පුත්තලම, කමන්දළුව හා හාඩි වතුවල ලෙලි කජු කි.ග්‍රෑ. 1 ක නිෂ්පාදන පිරිවැය වෙළඳපොළ මිළද ඉතා ඉහළ අගයකින් ඉක්මවා තිබුණි.

(ආ) සහනාධාර වැඩසටහන

සහනාධාර වැඩසටහන යටතේ 2010 හා 2011 වර්ෂවල බීජ හා බද්ධ කජු වගාව සඳහා ප්‍රාදේශීය කාර්යාල 08 කින් බෙදා දී තිබුණු කජු පැළ වලින් සමාලෝචිත වර්ෂය අවසානයට සාර්ථක වූ පැළ ප්‍රමාණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රාදේශීය කාර්යාලය | 2010 වර්ෂය | | | 2011 වර්ෂය | | |
|---|---|---|---|---|---|---|
| | ලබාදුන් පැළ ගණන | 2014 අවසානයට සාර්ථක වගා පැළ | ප්‍රතිශතය | ලබාදුන් පැළ ගණන | 2014 අවසානයට සාර්ථක වගා පැළ | ප්‍රතිශතය |
| බද්ධ කජු වගාව | | | | | | |
| මහියංගනය | 9,360 | 978 | 10 | 12,340 | 2103 | 17 |
| නාඋල | 23,520 | 4,167 | 18 | 22,600 | 5,938 | 26 |
| පුත්තලම | 45,960 | 6,920 | 15 | 48,160 | 10,372 | 22 |
| කුරුණෑගල | 35,440 | 9,101 | 26 | 30,160 | 8,031 | 27 |
| අම්පාර | 8,800 | 964 | 11 | 14,720 | 1,607 | 11 |
| මඩකලපුව | 19,600 | 2,940 | 15 | 12,000 | 3,020 | 25 |
| අනුරාධපුරය | 34,200 | 5,355 | 16 | 35,480 | 7,969 | 22 |
| බීජ කජු වගාව | | | | | | |
| ත්‍රිකුණාමලය | 2,200 | 134 | 6 | 8,000 | 787 | 10 |
| මඩකලපුව | 14,000 | 3,502 | 25 | 8,000 | 2,400 | 30 |
| අම්පාර | | | | 4,000 | 377 | 9 |
| එකතුව | 193,080 | 34,061 | | 195,660 | 42,610 | |

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සංස්ථාවේ ඉහළ කළමනාකරණ තනතුරුවල පුරප්පාඩු 02 ක් පැවතුණු අතර විධායක සහ විධායක නොවන ශ්‍රේණිවල පුරප්පාඩු 25 ක්ද සුළු සේවක පුරප්පාඩු 09 ක්ද වශයෙන් අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු 36 පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 නොවිසඳී ඇති විගණන ඡේද

2012 ජුලි 24 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කරන ලද සංස්ථාවට අයිතිය නොමැති කජු ඉඩම්වල නිත්‍යානුකූල අයිතිය සංස්ථාවට පවරා ගැනීම 2015 අප්‍රේල් 30 දක්වාම නිවැරදි වී නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයා වෙත යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) තොග පාලනය.

(ආ) වරලත් අලෙවි සැල් වෙත කජු මද අලෙවි කිරීම

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

**ශ්‍රී ලංකා කපු සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය පකාරව නිකුත්කළ විගණකාධිපති වාර්තාවේ අන්තර්ගත කරුණු සඳහා අදහස් දැක්වීම් හා ගැනීමට යෝජිත පියවර.**

2.2.1 (අ) ඉදිරියේදී මෙම මිණුම්කරණ පදනම් අවසාන ගිණුම්වල නිසි ආකාරයෙන් හෙළිදරව් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.

2.2.1 (ආ) මෙහි සමහර නිෂ්පාදන යන්නෙන් අදහස්කර ඇත්තේ කුමන නිෂ්පාදන ද යන්න පැහැදිලි නොමැත. කෙසෙ නමුත් තත්ත්ව පාලන කියාවලියේදී ගුණාත්මක භාවයෙන් අඩු කපු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනයන් වෙළඳපොල තරඟකාරී මිල ගණන්වලට සාපේක්ෂව නිෂ්පාදන පිරිවැයට වඩා අඩු විකුණුම් මිලක් යටතේ විකුණනු ලබන අවස්ථාවන් ඇත. මෙවැනි කියාමාර්ගයක් අනුගමනය නොකලේ නම් එම නිෂ්පාදනයන් අවසානයේදී අලෙවිකල නොහැකි මට්ටමට පත්වන හෙයින් එමගින් දැරීමට සිදුවන අලාභය මේ මගින් අවම කරගෙන ඇත. කෙසෙ වුවද," අනෙකුත් නිෂ්පාදනවල විකුණුම් මිල තීරණය කිරීමේදී ඉහත සඳහන් කල අලාභයන් ආවරණය කරගත හැකි පරිද්දෙන් එම මිල ගණන් නියම කර ඇත.

කෙසෙ නමුත් පවර්තන වර්ෂයේදී (එනම් 2015 වර්ෂයේදී) වරලත් ගණකාධිකාරීවරයෙකුගේ උපදේශකත්වය යටතේ සංස්ථාවේ සියලූ කපු මද නිෂ්පාදන සම්බන්ධයෙන් වෙන්ව වෙන්ව පිරිවැය ගණනය කිරීමේ කමවේදයන් සකස් කරවා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට ආරම්භ කර ඇත.

2.2.1 (ඇ) මෙය ඉදිරිපත් කිරීමේ දෝෂයකි. කෙසෙ වුවද, ආදායම් පකාශයෙන් මූල්‍ය තත්ත්ව පකාශය කරා ගෙනයන අවසාන ලාභාලාභ ශෙෂයට මෙමගින් බලපෑමක් එල්ල වී නොමැත.

2.2.1 (ඇ)(i) මෙහි සඳහන් වාහන සම්බන්ධයෙන් සිදුකරන ලද පත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනය වන්නේ 2009.01.01 දින දීය. අදාල වාහන පත්‍යාගණනය සිදුකර ඇත්තේ ස්වාධීන තක්සේරුකරුවෙකු වන තේ මණ්ඩලයේ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු ඇතුළු කමිටුවක් මගිනි. අදාල හෙළිදරව්කිරීම් මූල්‍ය පකාශනවල දැක්වීමට කටයුතු කරනු ඇත.

2.2.1 (ඇ) (ii) මේ යටතේ දක්වා ඇති ක්ෂයවීම්වලට අදාල හෙළිදරව්කිරීම් ගිණුම්පොත්වල සිදුකර ඇත.

2.2.1 (ඇ)(iii) (iv)

පවර්තන වර්ෂයේදී සංස්ථාවේ සියළුම වත්කම් පත්‍යාගණනය කර එහි පතිඵල ගිණුම්පොත්වල දැක්වීමට හා කටයුතු කරනු ඇත.

2.2.1 (ඉ) 2014 වර්ෂයට අදාල පාරිතෝෂික වෙන් කිරීම් තක්සේරු කර ගැනීම සඳහා සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකු ඉතා අපහසුවෙන් සම්බන්ධ කරගන්නා ලදී. අදාල කාර්යය සිදුකිරීමට පෙර ඒ සඳහා එම තක්සේරුකරුගෙන් අදාල වෘත්තීය ගාස්තු සම්බන්ධයෙන් මිල ගණන් කැඳවන ලදී.

එහිදී ඉදිරිපත් වූ වෘත්තීය ගාස්තු වටිනාකම ඉතා ඉහළ අගයක් ගත් නිසාත්" ඒ සඳහා මුදල් පතිපාදන සංස්ථාව සතුව නොමැති නිසාත්" වෙනයම් සුදුසුකම්ලත් තක්සේරුකරුවෙකු සම්බන්ධකර ගත නොහැකි වූ නිසාත්, අපගේ දැනුම හා පළපුරුද්ද අනුව පාරිතෝෂික වෙන් කිරීම් සඳහා පායෝගිකව ගැලපෙන සෙ වටිනාකම් ආදේශනය කර එය ගිණුම් පොත් වලට ගැලපීම සිදුකරන ලදී.

2.2.1 (ඊ) (උ) මේ සම්බන්ධයෙන් දැනටමත් අදාල උපදේශනාත්මක සෙවාවන් ලබාගැනීම පිළිබඳව මුලික සාකච්ඡාවක් සිදුකර ඇත. මෙහි සඳහන් මිණුම්කරණයන් සම්බන්ධයෙන් වැයවන වියදම සහ පතිපාදන පිළිබඳව සලකා බලා ඉදිරියේදී සුදුසු කටයුතු සිදුකරනු ඇත.

2.2.2. (අ) වරලත් අලෙවිසැල් වෙත අලෙවිකරන ලද සියළුම කජු මද වෙනුවෙන් මුදල් ලැබී ඇති බවට තහවුරු කරගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් විධිමත් පරිදි ලේඛණ නඩත්තු කරනු ලබයි. සාමාන්‍යයෙන් පෞද්ගලික අංශයේ වරලත් අලෙවිසැල් වලට කජු මද නිකුත් කරන්නේ අත්පිට මුදලටයි. එහෙත් අවස්ථා කිහිපයකදීම විවිධ පායෝගික හේතුන් මත එම ආයතනවලින් කජු මද සඳහා විකුණුම් අවස්ථාවේදීම මුදල් ලබාගැනීමේ යම් යම් පමාදයන් සිදුවී ඇත. කෙසෙ නමුත් පවර්තන වර්ෂයේ සිට එවැනි මුදල් පමාදවීම් සිදුවන අවස්ථාවන්හිදී ඒවා ණයට විකුණුම් ලෙස සලකා එම ණයට විකුණුම් සඳහා ඉන්වොයිස්පතක් අදාල ආයතන වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

2.2.2 (ආ) විගණන වාර්තාවේ සඳහන් රාජ්‍ය පදාන සම්බන්ධයෙන් වන විශ්ලේෂණය සංස්ථාවේ ගිණුම් පොත්වලට අනුව පහත පරිදි වෙනස් විය යුතුය.

| | | |
|---|---|---|
| රාජ්‍ය පදාන ගිණුමේ ශෙෂය | රු. | 78,956,936/= |
| ස්ථාවර වත්කම්වල ශුද්ධ අගය | රු. | 18,631,172/= |
| මේරූ පදේශ වියදම්වල ශුද්ධ අගය | රු. | 18,785,806/= |
| නොමේරූ පදේශවල වියදම් - කජු වගාව | රු. | 21,603,729/= |
| නොමේරූ පදේශවල වියදම් - පොල් වගාව | රු. | 4,249,099/= |
| තේක්ක වගා ව්‍යාපෘතිය | රු. | 366,607/= |
| වෙනස | රු. | 15,320,523/= |

ඉහත වෙනස මඟින් දැක්වෙන්නේ සමාලෝචිත වර්ෂයේ අගභාගයේදී මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති නමුත් සමාලෝචිත වර්ෂය තුලදී වැය කිරීමට නොහැකි වූ රාජ්‍ය පදාන වටිනාකම වන අතර" එම වටිනාකම පවර්තන වර්ෂය තුලදී අදාල සංවර්ධන කාර්යයන් සඳහා වැය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

2.2.2 (ඇ) සංස්ථාවේ ගිණුම්පොත්වලට අනුව පාරිතෝෂික වෙන්කිරීම් හා පාරිතෝෂික ගෙවීම්වල වටිනාකම් පිලිවෙලින් රු 9,743,212/- ක් සහ රු. 1,203,588/- ක් වේ. එම වටිනාකම් ඒ ආකාරයෙන්ම මුදල් පවාහ පකාශයේ දක්වා ඇත.

2.2.3 හානි වූ කජු පැළ

සහනාධාර යෝජනා කමය යටතේ සහ විවිධ ව්‍යාපෘති යටතේ බෙදාහැරීම සඳහා බද්ධ හා බීජ කජු පැළ නිෂ්පාදනයන් සංස්ථාවේ මධ්‍යම පැළ තවාන්වලින් සිදුකරනු ලබයි. එසෙ මධ්‍යම පැළ තවාන්වලින් නිෂ්පාදනය කරනු ලබන බද්ධ හා බීජ පැළ සම්බන්ධයෙන් අදාල තවාන් අධීක්ෂණ නිලධාරීන් විසින් සති දෙකකට වරක් පූර්ණ විශ්ලේෂණ වාර්තාවක් පධාන කාර්යාලය වෙත එවනු ලබන අතර, එම විශ්ලේෂණ වාර්තාවල හානිවූ කජුපැළ සම්බන්ධයෙන් ද විස්තර වාර්තාවක් අඩංගු වේ.

එම පැළ තවාන් විශ්ලේෂණ වාර්තාවල පිටපත් බාහිර විගණකවරුන්ගේ පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

**කජු පැළ අලෙවිය.**

සංස්ථාවට පාලනය කළ නොහැකි විවිධ බාහිර පායෝගික හේතූන් මත මෙහි සඳහන් කජු පැළ පමාණය ඒවා ලිඛිතව ඇණවුම් කළ අදාල පාදේශීය ලේකම්වරුන් විසින් සංස්ථාවේ වාණිජ තවාන්වලින් ඉවත් කරගෙන නොමැත.

මේ අනුව පවර්තන වර්ෂයේදී මූල්‍ය පකාශ සකස් කිරීමේදී ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකරනු ඇත.

2.2.4 සංස්ථාවේ කාර්යභාරයන්ට සහ අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි මෙම ජීප් රථය සංස්ථාව විසින් උපයන ලද අරමුදල් භාවිතා කර මිලදී ගෙන ඇත. ජීප් රථයේ සම්පූර්ණ වටිනාකම අදාල සමාගමට ගෙවා Brand New තත්ත්වයෙන් එම වාහනය අදාල සමාගමෙන් මිලදී ගන්නා ලදී.

2.3 (අ) මෙහි සඳහන් ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයෙන් ලැබියයුතු ණය සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයේ සහ සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

ඒ අනුව 2015.05.28 වන දින පැවති සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහා භාණ්ඩාගාරයේ අවශ්‍ය අනුමැතීන් ලබාගනිමින් අදාල ණයගැති ශෙෂය ගිණුම්පොත්වලින් කපාහැරීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. මේ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ඇත.

2.3 (ආ) මෙහි සඳහන් කර ඇති රඳවාගැනීමේ බදු වටිනාකම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් සංස්ථාව වෙත ලැබිය යුතු වන අතර" කිහිපවිටක්ම ලිඛිතව මෙම මුදල සංස්ථාව වෙත ලබාදෙන ලෙස ඉල්ලීම් කල ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් එම වටිනාකම සංස්ථාව වෙත ලබා දී නොමැත.

2.3 (ඇ) මෙම විගණන විමසුමෙ සඳහන් බැරකම් සම්බන්ධයෙන් ද රේඛීය අමාත්‍යාංශයේ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්වලදී දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කර ඇති අතර, වී අලෙවි මණ්ඩලය සඳහා ගෙවිය යුතු වටිනාකම සඳහා සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගනිමින් මුදල් පතිපාදන ලැබෙන ආකාරය අනුව ඉදිරියේදී අදාල ගෙවීම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ.

මෙහි සඳහන් ගෙවියයුතු සහනාධාර හා ගෙවිය යුතු අස්වනු රක්‍ෂණ මුදල් යන බැරකම් සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ අවශ්‍ය අනුමැතීන් ලබාගනිමින් අදාල බැරකම් ශෙෂයන් ගිණුම් පොත්වලින් කපාහැර ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමට 2015.05.28 දින පැවති සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

2.3 (ඈ) මෙහි දක්වා ඇති හිඟ මුදල් අදාල වර්ෂයන් සඳහා අදාල දිස්ත්‍රික්කයන් හි දිස්තික් ලේකම්වරුන්ගෙන් ලබාගතයුතු නමුත් නොකඩවා ඉල්ලීම් ඉදිරිපත් කල ද අදාල ආයතනවල මුදල් පතිපාදන ගැටළු මත එම මුදල් මේ දක්වා සංස්ථාව වෙත ලැබී නොමැත.

2.4 (අ) (ඇ) මෙම සංස්ථාව වාණිජ කටයුතු යටතේ ඉතා සීමාසහිත ලාභයක් උපයන අතර, එම ලාභයෙන් සැලකියයුතු විශාල මුදලක් සංස්ථාවේ සෙවා කටයුතු පවත්වාගෙන යාම සඳහා වැයකරනු ලබයි. මීට අමතරව විශාල සෙවක සංඛ්‍යාවකට ස්ථිර සහ අනියම් පදනම මත රැකියා අවස්ථා උදාකර දී ඇති අතර, වැටුප් සඳහා විශාල මුදලක් සංස්ථාව විසින් උපයා ගතයුතු වේ. මෙවැනි වාතාවරණයක් තුල ආදායම් බදු ගෙවීම සඳහා අමතර පිරිවැයක් දැරීම පායෝගික වශයෙන් සිදු කල නොහැකිය. එසෙ කිරීමට හැකිවනු පිණිස සංස්ථාවේ නිෂ්පාදනවල මිල ඉහළ නැංවීම සිදු කළහොත් එය වෙළෙඳපොල තරඟකාරීත්වයට ඉතා අහිතකර ලෙස බලපානු ලැබේ. මේ තත්ත්වය මත ආදායම් බදු සහ අනෙකුත් බදු ගෙවීම් අහෝසිකර ගැනීම සම්බන්ධයෙන් දැනටමත් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ මූලික සාකච්ඡා පවත්වා ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.4 (ඈ) 2014 වර්ෂයේ සැප්තැම්බර් මස සිට කියාත්මක වන පරිදි අදාල ජීවන වියදම් දීමනාව ගෙවීම් නවතා ඇත.

4.1 (අ) (i) අතීත අත්දැකීම් අනුව අනෙකුත් වතුයායන්ට සාපේක්ෂව සංස්ථාවට උපරිම පතිලාභයක් ලබාගත හැකි සංස්ථාව සතු කොණ්ඩච්චි වතුයායේ ඉදිරි වසර කිහිපය තුලදී නැවත වගාවන් සිදුකිරීමට පාලනාධිකාරිය විසින් තීරණය කරන ලදුව 2014 වර්ෂයේදී කොන්ඩච්චි වතුයායේ අක්කර 100 ක් අළුතින් කජු වගා කරන ලදී. එසෙම පවර්තන වර්ෂය (එනම් 2015 වර්ෂය) තුලදී තවත් අක්කර 400 ක් කොන්ඩච්චි වතුයායේ අලුතින් වගාකිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතී.

4.1 (අ) (ii ) පුත්තලම, කමන්දළුව හා හාඩි යන වතුයායන්වල වයස් මට්ටම වසර 30 කට වඩා වැඩි කජු වගාවන් පැවතීම නිසා එම වතුයායන් හි ඵලදායිතාවය ඉතා අඩුවී ඇත. විශෙෂයෙන්ම 2014 වර්ෂයේ අස්වනු සමයේදී පැවති අයහපත් කාලගුණික තත්ත්වය නිසා මෙම වතුයායන් හි කජු අස්වැන්න ඉතා අඩු මට්ටමක පැවතිණි. මේ අනුව එම වතුයායන් හි ලෙලි කජු කිලෝග්‍රෑම් 01 ක නිෂ්පාදන පිරිවැය ඒවායේ වෙළෙඳපොල මිල ඉක්මවා ගොස් ඇත.

4.1 (ආ) (i) (iii) බද්ධ කජු වගාව සඳහා සහනාධාර යෝජනා කමය ආරම්භ කරන ලද්දේ 2000 වර්ෂයේදී වන අතර, ඉඩම් අක්කර 01 ක වගාවක් සඳහා රු. 9,500/= ක සහනාධාර මුදලක් ඒ යටතේ අදාල පතිලාභීන්ට හිමි විය. මේ වනවිට මෙම සහනාධාර යෝජනා කමය ආරම්භ කර වසර 15 කට ආසන්න කාලසීමාවක් ගතව ඇතත් සහනාධාර මුදලෙහි කිසිදු වැඩිවීමක් සිදුවී නොමැත.

මෙම තත්ත්වය මත විශෙෂයෙන්ම මෙම ව්‍යාපෘතියේ ඉලක්කගත පතිලාභීන් වන අධික දිළිඳුභාවයෙන් පෙළෙන ගොවීන්ට සිය වගාවන් නිසි පරිදි නඩත්තු කිරීම ගැටළුසහගත වී ඇති බැවින් සමස්ථ වගාවන් හි සාර්ථකත්වය අඩුවීමට එය තදින්ම බලපා ඇත.

මීට පිළියමක් වශයෙන් වගා අක්කරයක සහනාධාර මුදල රු. 25,000/= ක් දක්වා වැඩි කිරීමට මහා භාණ්ඩාගාරයෙන් කිහිපවරක් අනුමැතිය ඉල්ලා ඇතත් මෙතෙක් ඒ සඳහා කිසිදු පතිචාරයක් ලැබී නොමැත.

කජු වගාවට උචිත වියළි කලාපයේ ඉඩම්වල වගා කරනු ලබන අනෙකුත් පධාන ආර්ථික භෝග වන පොල්, උක් වැනි වගාවන් සඳහා දෙනු ලබන සහනාධාර මුදල් කජු වගාව සඳහා ලබාදෙනු ලබන සහනාධාර මුදලට සාපේක්ෂව ඉහළ අගයක් ගනු ලැබේ. මෙම තත්ත්වය මත ගොවීන් කජු වගාව පිළිබඳව දක්වන උනන්දුව අඩු වී ඇත.
කජු වගාවන් හි සාර්ථකභාවය රැක ගැනීමට අදාල පරිදි ගොවීන් දැනුවත් කරමින් පවතින සීමිත සම්පත් යටතේ සංස්ථා ක්ෂෙත නිලධාරීන් සිය උපරිම ශක්ති පමාණයෙන් කටයුතු කළ ද ඉහත සඳහන් පරිදි ඒ සම්බන්ධයෙන් ගොවීන්ගේ උනන්දුව හීනවී යාම වගා සාර්ථකත්වය අඩුවීම කෙරෙහි දැඩිව බලපා ඇත.

එසෙම සමාලෝචිත වර්ෂයන් තුලදී වරින්වර කජු වගාවට අයහපත් ලෙස ක්‍රියාත්මක වන කාලගුණික හා දේශගුණික තත්ත්වයන් ද වගාවන් අසාර්ථක වීමට ද්‍රව්‍යාත්මක ලෙස බලපා ඇත. මෙම තත්ත්වයට පිළියම් වශයෙන් ගොවි පුහුණු වැඩසටහන් පැවැත්වීම, සංස්ථාවේ පර්යේෂණ අංශය මඟින් හඳුනාගත් ගොවි ගැටළු සඳහා විසඳුම් ලබාදීම හා නවීන තාක්ෂණික උපදෙස් ගොවීන් වෙත ලබාදීම වැනි කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

4.2 (අ) 2013 වර්ෂයෙදී "දිවි නැගුම" වැඩසටහන යටතේ අදාල පාදේශීය ලේකම්වරුන්ගේ ලැබුනු පැළ ඇණවුම්වලට සාපේක්ෂව නිෂ්පාදනය කරන ලද කජු පැළ එම වර්ෂයේ මහ කන්නයේ කාල සීමාව තුලදී බෙදා හරින ලද අතර, මෙම සංස්ථාවට පාලනය කළ නොහැකි විවිධ ගැටළුසහගත තත්ත්වයන් මත අදාල පාදේශීය ලේකම්වරුන් විසින් එම පැළවලින් විශාල පමාණයක් භාරගැනීම පතික්ෂෙප කරන ලදී.

එලෙස භාර නොගත් කජු පැළ පමාණය අදාල තවාන්වල පවත්වාගෙන ගිය නමුත් පාලනය කළ නොහැකි පහත දැක්වෙන හේතූන් මත එම පැළ මියයාම වලක්වාගැනීමට පායෝගික වශයෙන් හැකියාවක් නොමැති විය.

1. ඉතා විශාල කාලසීමාවක් කජු පැළ තවාන් භූමියේ පැවතීම මත ඒවා පොළවට මුල් ඇල්ලීම හා මුල් පද්ධතිය පාලනයෙන් බැහැර වීම.
2. කාලගුණික සහ දේශගුණික හේතූන් මත දිලීර රෝග පැතිරී යාම.
3. පැළය සජීවීව පවත්වා ගැනීමට අවශ්‍ය පෝෂණ ද්‍රව්‍ය සහ අනෙකුත් කෘෂිකාර්මික සාධක සැපිරීමට නොහැකි වීම.

මේ අනුව 2013 වර්ෂයේදී නිෂ්පාදිත පැළ විශාල සංඛ්‍යාවක් ඉහත දක්වා ඇති හේතූන් මත 2014 වර්ෂයේදී මියයාම වලක්වා ගත නොහැකි විය.

මෙම ගණනය කිරීමේදී එම මියගිය මුළු පැළ සංඛ්‍යාව 2014 වර්ෂයට ගලපා ගණනය කිරීම් සිදුකර තිබීම හේතුවෙන් මෙම විගණන විමසුමේ සඳහන් පරිදි ඉහළ පැළ මියායම් පතිශතයක් නිර්මාණය වී ඇත. කෙසෙ නමුත් සමාලෝචිත වර්ෂයේදී විශෙෂයෙන්ම බද්ධ පැළවල මියයාම 3%-4% ක අවම ප්‍රතිශතයක් යටතේ පවත්වා ගැනීමට හැකිවී ඇත.

4.2 (ආ) වතුයායන් සම්බන්ධයෙන් වාර්ෂිකව නඩත්තුව සඳහා වැය වන වියදම උපරිම වශයෙන් සීමා කල ද සෙවක වැටුප්, වතු නඩත්තු කටයුතු, පොහොර භාවිතය, වල් මර්ධනය පලිබෝධ මර්ධනය ආදී කෘෂිකාර්මික කටයුතු අනිවාර්යයෙන්ම සිදුකල යුතුව ඇත.

කජු අස්වැන්න ලැබෙනුයේ වාර්ෂිකව එක් වතාවක් පමණක් වන අතර, පාලනය කල නොහැකි දේශගුණික සහ කෘෂිකාර්මික හේතුන් මත අස්වැන්න ලැබීම ද වෙනස් වේ. ඒ අනුව 2014 වර්ෂයේදී මෙහි සඳහන් වතුයායන්වල අස්වැන්න අඩුවී ඇත. එම හේතුවෙන් මෙහි දක්වා ඇති මෙහෙයුම් අලාභයන් නිර්මාණය වී ඇත.

4.3 සංස්ථාවේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයේ පවතින නීතිරීතිවලට අනුව අදාල මුදල් ගෙවීම් සිදුකර ඇත.

4.4 සංස්ථාවේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සඳහා පමණක් වාර්ෂිකව රු. මිලියන 90 කට ආසන්න මුදලක් අවශ්‍යවන නමුත්, භාණ්ඩාගාරයෙන් වැටුප් හා අනෙකුත් පුනරාවර්තන වියදම් යටතේ ලැබෙන මුළු මුදල රු. මිලියන 50 කි. මේ අනුව ස්ථිර කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සඳහා පමණක් රු. මිලියන 40 කට අධික මුදලක් සංස්ථාව මඟින් උපයාගත යුතුව ඇත. මේ තත්ත්වය පිළිබඳව උපරිම අවධානය යොමු කර අදාල පුරප්පාඩු පිරවීම සිදුකරනු ලැබේ.

5.1 මෙහි සඳහන් ඉඩම් අයිතිය පවරා ගැනීමේ කටයුතු සඳහා පවතින නීතිරීති හා ක්‍රියාපිළිවෙල අනුව දීර්ඝකාලයක් ගතවන අතර, මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය මගින් අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

6. (අ) (ආ) ඉදිරියේදී මෙම පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශෙෂ අවධානය යොමු කර කටයුතු කරනු ඇත.

| ශ්‍රී ලංකා කජු සංස්ථාව | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂ 05 ක ගිණුම් සාරාංශය | | | | | |
| | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
| **ලාභ ලාභ ගිණුම** | රු. | රු. | රු. | රු. | රු. |
| ශුද්ධ විකුණුම් | 115,370 | 134,180 | 150,107 | 117,750 | 71,171 |
| විකුණුම් පිරිවැය | (62,376) | (82,586) | (59,939) | (58,707) | (50,135) |
| **දළ ලාභය** | **52,994** | **51,594** | **90,168** | **59,043** | **21,036** |
| අනෙකුත් ආදායම් | 4,219 | 10,494 | 1,846 | 2,947 | 1,301 |
| පුනරාවර්තන ප්‍රදාන | 21,235 | 22,775 | 25,910 | 22,403 | 16,959 |
| පරිපාලන වියදම් | (53,396) | (43,493) | (44,455) | (35,383) | (29,403) |
| ක්‍රමක්ෂය | (3,283) | (3,045) | (3,715) | (3,491) | (3,590) |
| **වාණිජ කටයුතුවලින් ලත් ශුද්ධ ලාභය** | **21,769** | **38,325** | **69,754** | **45,519** | **6,303** |
| **සෙවා අංශය - ආදායම් ඉක්මවූ වියදම්** | **(47,826)** | **(37,358)** | **(25,520)** | **(25,070)** | **(21,358)** |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(26,057)** | **967** | **44,234** | **20,449** | **(15,055)** |
| ශෙෂ පත්‍රය | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | |
| දේපල පිරියත සහ උපකරණ | 77,005 | 63,916 | 64,986 | 4,509,794 | 4,506,381 |
| මේරූ ප්‍රදේශ නඩත්තුව | 35,141 | 30,466 | 31,620 | 66,480 | 67,803 |
| පර්යේෂණ සහ සංවර්ධන වියදම් | 1,046 | 215 | - | - | - |
| නොමේරූ ප්‍රදේශ නඩත්තුව | 25,853 | 29,288 | 19,982 | 40,559 | 41,039 |
| අනෙකුත් කුඩා ව්‍යාපෘති | 615 | 619 | 707 | 739 | 807 |
| **මුළු ජංගම නොවන වත්කම්** | **139,660** | **124,504** | **117,295** | **4,617,572** | **4,616,030** |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 48,712 | 29,460 | 46,135 | 37,706 | 25,102 |
| වෙලඳ ණය ගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ | 24,843 | 60,042 | 70,822 | 7,744 | 10,916 |
| අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් | 10,080 | 5,461 | 3,374 | 2,464 | 2,480 |
| මුදල් හා මුදල් සමාන දෑ | 60,879 | 66,529 | 28,676 | 45,787 | 5,864 |
| **මුළු ජංගම වත්කම්** | **144,514** | **161,492** | **149,007** | **93,701** | **44,362** |
| **මුළු වත්කම්** | **284,174** | **285,996** | **266,302** | **711,273** | **4,660,392** |
| හිමිකම් සහ වගකීම් | | | | | |
| හිමිකම් | | | | | |
| මූලික ප්‍රාග්ධනය | 40,000 | 40,000 | 40,000 | - | - |
| රාජ්‍ය ප්‍රදාන | 78,957 | 58,745 | 34,959 | 258,822 | 251,952 |
| අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන | 19,304 | 19,691 | 17,911 | 13,570 | 13,570 |
| ප්‍රාග්ධන සංචිත | 22,215 | 22,241 | 23,676 | 4,464,179 | 4,464,178 |
| ලාභාලාභා ගිණුම | 56,278 | 81,339 | 77,788 | (88,803) | (109,252) |
| **මුළු හිමිකම්** | **216,754** | **222,016** | **194,334** | **4,647,768** | **4,620,448** |
| ජංගම නොවන වගකීම් | | | | | |
| පාරිතෝෂිත දීමනා සඳහා වෙන්කිරීම් | 42,415 | 33,875 | 31,272 | 27,835 | 24,451 |
| වාහන කල්බදු | - | 3,257 | 6,513 | - | - |
| **මුළු ජංගම නොවන වගකීම්** | **42,415** | **37,132** | **37,785** | **27,835** | **24,451** |
| ජංගම වගකීම් | | | | | |
| වෙළඳ ණය හිමියෝ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 25,005 | 26,849 | 34,183 | 35,670 | 15,492 |
| **මුළු ජංගම වගකීම්** | **25,005** | **26,849** | **34,183** | **35,670** | **15,492** |
| **මුළු ස්කන්ධ සහ වගකීම්** | **284,174** | **285,997** | **266,302** | **4,711,273** | **4,660,391** |
| ශුද්ධ වත්කම් ප්‍රතිලාභය % | (12.0) | 0.44 | 22.76 | 0.44 | (0.33) |
| ශුද්ධ ලාභ අනුපාතය % | (22.6) | 0.7 | 29.5 | 17.4 | (21.2) |
| ජංගම අනුපාතය | 5.8 | 6.0 | 4.4 | 2.6 | 2.9 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 3.8 | 4.9 | 3.0 | 1.6 | 1.2 |
| මුළු ආදායමට මුළු වියදම | 0.9 | 1.0 | 1.6 | 1.2 | (0.9) |